# කාර්යසාධන වාර්තාව - 2017

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ආයතනික ව්‍යුහය | |
| 1.1 | දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර | 2 |
| 1.2 | හැඳින්වීම | 3 |
| 1.3 | දෙපාර්තමේන්තුවේ කාර්යයන් | 4 |
| 1.4 | සංවිධාන සටහන | 5 |
| 2. | 2017 වර්ෂයේ කාර්යසාධනය | |
| 2.1 | සමාලෝචනය | 6 - 7 |
| 2.2 | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා | 7 - 16 |
| 2.3 | ක්ෂුද්‍රමූල්‍යනය | 16 - 18 |
| 2.4 | කෘෂිකර්මාන්තය | 18 - 24 |
| 2.5 | කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය | 24 - 26 |
| 2.6 | ආහාර සුරක්ෂිතතාවය | 26 - 29 |
| 2.7 | පශු සම්පත් අංශයේ සංවර්ධනය | 29 - 31 |
| 2.8 | ඉලක්කගත කණ්ඩායම් සඳහා විශේෂ දිරි දීමනා | 31 - 32 |
| 3. | පරිපාලන හා මූල්‍ය කාර්යසාධනය | |
| 3.1 | පරිපාලන අංශය | 33 - 41 |
| 3.2 | මූල්‍ය අංශය | 42 - 43 |
| 3.3 | විගණන විමසුම් | 44 |

# 1. ආයතනික ව්‍යුහය

## 1.1. දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර

**දැක්ම**

*"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රධාන නියෝජිත ආයතනය බවට පත්වීම"*

**මෙහෙවර**

*"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම"*

## 1.2 හැඳින්වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. නිලධාරීන් 13 දෙනෙකු ප්‍රමුඛ 34 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අංශ හතරක් යටතේ පහත පරිදි දැක්විය හැක.

### 1.2.1. ප්‍රාථමික සංවර්ධන අංශය

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැගී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

### 1.2.2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම්ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම්ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් ඛාණ්ඩයන් හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

### 1.2.3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබා දෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් සියයට 75 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 45 ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

### 1.2.4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්

නිෂ්පාදකයින්ට තම වගා බිමේ දී ලබා දෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳපොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහායන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## 1.3 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

- ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මඟින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

- රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

- රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

## 1.4 සංවිධාන සටහන




| | |
|---|---|
| නි.අ. | - නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ |
| තො.ස. හා තා.නි. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරි |
| ස.නි. | - සංවර්ධන නිලධාරි |
| තො.ස. හා තා.ස. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර |
| රා.ක.ස. | - රාජ්‍ය කළමනාකරණ සහකාර |
| ක.ස. | - කළමනාකරණ සහකාර |
| රිය. | - රියදුරු |
| කා.කා.ස. | - කාර්යාල කාර්ය සහයක |

## 2. 2017 වර්ෂයේ කාර්යසාධනය

### 2.1 සමාලෝචනය

රජය විසින් මෑතකාලීනව ඉදිරිපත් කරන ලද නීල-හරිත සංවර්ධන ක්‍රමෝපාය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය රටේ ආර්ථික වර්ධනය හා සමාජීය සංවර්ධනය සඳහා වැදගත් ක්‍රමෝපාය ක්ෂේත්‍රයක් ලෙස පිළිගෙන ඇත. රැකියා අවස්ථා හා ආදායම් උත්පාදනයේ, දුප්පත්කම දුරුකරලීමේ, අපනයන ප්‍රවර්ධනයේ හා ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 2017 වර්ෂය තුළ දී ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. මූල්‍ය සඳහා වූ ප්‍රවේශය හා බැඳුණු ගැටළු නිරන්තරයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ වර්ධනය හා ව්‍යාප්තියට බාධා පැමිණවීමත් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සාපේක්ෂව අඩු විභවතාවයකින් යුක්ත වීමත් යන ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා විවිධ විදේශ මූල්‍ය ආයතන හා දේශීය අරමුදල්වල සහාය ඇතිව පැවති සියළුම රජයන් අවස්ථානුකූලව විවිධ උත්සහායන් දරා ඇත.

මූල්‍ය සඳහා වූ ප්‍රවේශය යන ගැටළුව තවමත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායට බලපාන ප්‍රධාන ගැටළුවක් වශයෙන් පැවතීම නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහාය වීම සඳහා "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යන තේමාව යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් ඇතුළත් පුළුල් පැකේජයක් (Package) හඳුන්වා දෙන ලදී. මෙමඟින් ඓතිහාසිකව ශ්‍රී ලාංකිකයින් සතුව පැවති සහජ ව්‍යාපාරික නිපුණතාවයන් ප්‍රයෝජනයට ගනිමින් "ව්‍යාපාරික පාරාදීසයක්" (Pradise of Enterpreneurs) නැවත ගොඩ නැඟීමට අපේක්ෂා කෙරේ. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩසටහන" තුළ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම 11 ක්, විදේශීය මූල්‍ය ආයතනවල සහන ඇතිව ක්‍රියාත්මක වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 3 හා මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් ලබාදෙන වැඩසටහන් 2 ක් ද ඇතුළු සුවිශේෂී යෝජනා ක්‍රම 16 ක් අන්තර්ගත වේ.

ඒ අනුව, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් පමණක් නොව මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය, ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, ගිණුම් හා වාර්තා තැබීම, බදු ගණනය, වෙළඳපොල සම්බන්ධතා සංවර්ධනය හා ප්‍රතිමිල දී ගැනීම් කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය නොවන තාක්ෂණික සහාය ද ලබා දේ. ව්‍යාපාරික පරිසරය තුළ සිටින ගොවීන්, තරුණයින්, කාන්තා ව්‍යවසායකයින්, ස්වයං රැකියා නියුක්තිකයින් සහ අනෙකුත් විශේෂ ඉලක්කගත කණ්ඩායම් යන සියළු කොටස් මෙම වැඩසටහන මඟින් ආවරණය වේ. මෙම "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් නිෂ්පාදන ආර්ථිකය දිරිමත් කිරීම සහ ඒක පුද්ගල ආදායම ඇ.එ.ජ. ඩොලර් 5,000 ක් දක්වා වැඩි කිරීම, මිලියනයක රැකියා අවස්ථා බිහි කිරීම, අපනයන ආදායම දෙගුණ කිරීම, සියයට 5 ක අඛණ්ඩ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයක් අත්කර ගැනීම යන රජයේ මධ්‍යකාලීන ඉලක්ක ලඟා කර ගැනීමට ද අපේක්ෂා කෙරේ.

2017 වසර තුළ රජය විසින් විශාල වශයෙන් ආයෝජනය කරන ලද තවත් ක්ෂේත්‍රයක් ලෙස කෘෂිකර්මාන්ත අංශය, හඳුන්වා දිය හැක. ගොවි ප්‍රජාව වෙත උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා රජයේ පොහොර සඳහා වූ මුදල් සහනාධාර වැඩසටහන, "කෙතට අරුණ පොහොර දිරිය", ජාතික වගා රක්ෂණ යෝජනා ක්‍රමය, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වී මිල දී ගැනීමේ වැඩසටහන සහ නවීන කෘෂි ගබඩා සංකීර්ණ ඉදි කිරීමේ වැඩසටහන යන ප්‍රධාන වැඩසටහන් අවශ්‍ය පුළුල් කිරීම් සහිතව 2017 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

සියළුම වී ගොවීන්, වැවිලි අංශයේ කුඩා වතු හිමියන් හා බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූණු හා මිරිස් වගා කරන සුළු පරිමාණ ගොවීන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන පොහොර සඳහා මුදල් සහනාධාර වැඩසටහන 2017 වසරේ දී ද ක්‍රියාත්මක කරන ලදී. මෙම මූල්‍ය සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට උපරිම ප්‍රතිලාභ ලබා දීම අරමුණින් එම මූල්‍ය සහනාධාරය අදාළ ගොවි මහතුන්ගේ බැංකු ගිණුමට සෘජුවම බැර කිරීමට කටයුතු කරන ලදී. මෙම නව ක්‍රමවේදය තුළින් තමතමන්ට කැමති පරිදි රසායනික පොහොර, කාබනික පොහොර හෝ මිශ්‍ර පොහොර භාවිත කිරීමටත් අවශ්‍ය පොහොර ප්‍රමාණය විවෘත වෙළඳපොලෙන් මිල දී ගැනීමටත් ගොවීන්ට නිදහස ලැබුණි. අනෙක් අතට, පූර්ණ රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික හෝ මිශ්‍ර පොහොර භාවිතයට ගොවීන් දිරි ගන්වන බැවින් මෙම නව ක්‍රමය

තුළින් රසායනික පොහොර අධිභාවිතය නිසා ඇති වන අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීමට ද මඟ පෙන්වයි.

ප්‍රධාන බෝග ආවරණය කිරීම සඳහා දර්ශක මත පදනම් වූ වගා රක්ෂණ යෝජනා ක්‍රමයක් නොමැති වීම නිසා පසුගිය කාලයේ ඇති වූ දැඩි නියඟයෙන් සිදු වූ වගා හානි පියවීමටත්, නියං සහනාධාර ලබා දීමටත් රු. බිලියන 5 කට වඩා වැඩි මුදලක් 2017 වසරේ දී රජයට දැරීමට සිදු විය.

එම නිසා, ප්‍රධාන බෝග 6 ක් සඳහා අක්කරයකට රු. 40,000 ක මූලික රක්ෂණාවරණයක් සහිතව ජාතික වගා රක්ෂණ යෝජනා ක්‍රමය රජය විසින් හඳුන්වා දෙන ලදී. ස්වභාවික ව්‍යවසනයන් නිසා සියළුම ප්‍රධාන බෝග සඳහා වන වගා හානි මෙමඟින් ආවරණය වන අතර සිදු වන වගා හානියේ වෙළඳපොල වටිනාකම මෙම වගා රක්ෂණ ක්‍රමය මඟින් පියවන නිසා රජය සහ ගොවීන්ට දැරීමට සිදු වන මූල්‍ය අවදානම මෙමඟින් අවම කෙරේ.

රටේ කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා තම ජීවිතයේ තරුණ අවධිය කැපකළ වැඩිහිටි ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2017 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගේ දායකත්වය සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවතීම නිසා ඒ සඳහා ද අවශ්‍ය සමස්ත වියදම රජය විසින් දරණ ලදී.

රජයේ සහතික මිල වී ගොවීන් හට ලබා දීම තහවුරු කිරීම සඳහා වී මිල දී ගැනීමේ වැඩසටහන 2017 වසරේ දී ද ක්‍රියාත්මක කරන ලදී. 2016/17 මහ හා 2017 යල කන්නවල දී වී අස්වැන්න අඩු වීම නිසා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද සහතික මිලට වඩා වැඩි මිලකට සමස්ත වී නිෂ්පාදනය පුද්ගලික අංශය විසින් මිල දී ගැනීම හේතුවෙන් 2017 වසරේ දී වී අලෙවි මණ්ඩලයට ගොවීන්ගෙන් වී මිල දී ගැනීමට නොහැකි විය. රට තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය නිසා 2017 වසරේ දී, ඊට පෙර වසරට සාපේක්ෂව වී නිෂ්පාදනයේ පහළ යාමක් වාර්තා වී තිබුණි. එම නිසා රටේ ජීවන වියදම සඳහා සෘජුවම බලපාන සහල් මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා සහල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) ඉවත් කිරීම මඟින් රජය දේශීය පරිභෝජනය සඳහා සහල් ආනයනය කිරීම දිරිමත් කරන ලදී.

එමෙන්ම දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමේ හා දේශීය වෙළඳපොල තුළ භාණ්ඩ සඳහා සාධාරණ සිල්ලර මිල ගණන් පවත්වා ගෙන යන අතරතුර ලෝක වෙළඳපොලේ පැවති මිල වාසිය (Price gain) රජයේ ආදායම බවට පරිවර්ථනය කිරීමේ අරමුණින් SCL, උපරිම සිල්ලර මිල (MRP) සහ ආනයන හා අපනයන සෙස් බදු අවස්ථානුකූලව සංශෝධනය කරන ලදී.

## 2.2 එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා

"එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" තේමාව යටතේ රජයේ මධ්‍යකාලීන සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදන ආර්ථිකය වේගවත් කිරීමට අවශ්‍ය රාජ්‍ය අංශයේ බලවේගයන් යොමු කරනු ලැබේ. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩසටහන" මඟින් ආර්ථික සංවර්ධනයේ ගාමක බලවේගය ලෙස හඳුනාගෙන තිබෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා සහාය වීමට ප්‍රධාන වශයෙන් අපේක්ෂා කෙරේ. එමෙන්ම, නවීන කෘෂි තාක්ෂණයන් යොදා ගනිමින් හා යාන්ත්‍රීකරණය කිරීම සඳහා අඩු වියදම් ප්‍රාග්ධනය සැපයීම තුළින් සුළු පරිමාණ යැපුම් කෘෂිකර්මාන්තයේ සිට වාණිජ මට්ටමේ කෘෂිකර්මාන්තයේ යෙදී සිටින කෘෂි නිෂ්පාදන සමාගම් හා ගොවීන් සඳහා ද සහාය වීමට අවධානය යොමු කර ඇත. එසේම, අනාගත බලශක්ති අර්බුදයට මුහුණ දීමේ අරමුණින් පොසිල ඉන්ධන බලශක්ති ප්‍රභවයන්ගේ සිට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරුවීමට අපේක්ෂා කරනු ලබන නිවාස හිමියන් හා කර්මාන්තකරුවන් මෙමඟින් දිරි ගන්වනු ලැබේ.

"එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන මඟින් ස්ථාපිත පුද්ගලික අංශයේ ව්‍යාපාර සඳහා පමණක් නොව රටේ ආර්ථික රාමුවේ ඉදිරි ප්‍රමුඛ බලවේගයන් මත ක්ෂුද්‍ර ව්‍යාපාර, ස්වයං රැකියාලාභීන්, තරුණ ව්‍යවසායකයින් සඳහා ද පහසුකම් සලසනු ලැබේ. එමෙන්ම, මෙම වැඩසටහන මඟින් සමාජයේ තෝරා ගත් ප්‍රමුඛ කණ්ඩායම වන පාසැල් වෑන් රථ හිමියන්ට වඩාත් සුරක්ෂිත පාසල් සේවාවක් ස්ථාපිත කිරීම සඳහා පැරණි වෑන් රථවල සිට ආසන 32 ට වැඩි බස්රථ වෙත මාරුවීමටත්, අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට තම නිවාස නිම කිරීමට හෝ වැඩි දියුණු කිරීමට

සහ දුෂ්කර තත්ත්වයන් යටතේ සේවය කරනු ලබන ජනමාධ්‍යවේදීන්ට අවශ්‍ය මාධ්‍ය උපකරණ මිල දී ගැනීමට ද පහසුකම් සලසනු ලැබේ. මූල්‍යමය සහාය පමණක් නොව සමාගම් සංස්ථාගත කිරීම, පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම, බදු ගණනය කිරීම, වෙළඳපොල අවස්ථා වැඩි දියුණු කිරීම, මූල්‍ය ආයතන සමග සාකච්ඡා කිරීම වැනි මූල්‍ය නොවන තාක්ෂණික සහාය ද "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන මඟින් ලබා දෙනු ලැබේ.

ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යවසායකයින්, ගොවීන්, තරුණ තරුණියන්, කාන්තා ව්‍යවසායකයින්, ස්වයංරැකියාලාභීන් සහ සමාජයේ විශේෂිත කණ්ඩායම් සඳහා සහාය වීමට "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩසටහන" යටතේ, පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම එකොළොහක් (11), විදේශ මූල්‍යාධාර ලබන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම තුනක් (03) සහ මූල්‍යමය නොවන ආධාරක වැඩසටහන් දෙකක් (02) ඇතුළත් වන ලෙස සකසන ලද යෝජනා ක්‍රම දාසයක් (16) ක්‍රියාත්මක වේ. සහනාධාර අනුපාතය, පොලී අනුපාතය, ප්‍රතිලාභීන්, උපරිම ණය මුදල ආදී ණය යෝජනා ක්‍රම පිළිබඳ විස්තර විශේෂ සටහන 2.1 හි දක්වා ඇත.

**විශේෂ සටහන 2.1 : "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය හා මූල්‍ය නොවන වැඩසටහන්**

| ණය යෝජනා ක්‍රමයේ නම | විස්තරය |
|---|---|
| **1. පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම** | |
| 1.1 රන් අස්වැන්න | **පළමු කාණ්ඩය**<br>ප්‍රතිලාභීන් - සුළු පරිමාණ ගොවීන් හා ගොවි සංවිධාන, විසිතුරු මල් වගාකරුවන්, මත්ස්‍ය වගාවේ නියැලෙන ව්‍යාපාරිකයින්<br>උපරිම ණය මුදල (රු.) - 5,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75%<br><br>**දෙවන කාණ්ඩය**<br>ප්‍රතිලාභීන් - කෘෂි සැකසුම් ආයතන<br>උපරිම ණය මුදල (රු.) - 300,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75%<br><br>**තුන්වන කාණ්ඩය**<br>ප්‍රතිලාභීන් - වාණිජ පරිමාණ ගොවිපොල<br>උපරිම ණය මුදල (රු.) - 750,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75% |
| 1.2 ගොවි නවෝදා | ප්‍රතිලාභීන් - සුළු පරිමාණ ගොවීන්, ගොවි සංවිධාන (කෘෂිකාර්මික කටයුතු යාන්ත්‍රීකරණය කිරීම)<br>උපරිම ණය මුදල (රු.) - 500,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 75%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 3.38% |
| 1.3 රිය ශක්ති | ප්‍රතිලාභීන් - පාසැල් වෑන් රථ හිමියන්<br>උපරිම ණය මුදල (රු.) - 4,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 75%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 3.38% |
| 1.4 රිවි බල සවි | ප්‍රතිලාභීන් - සූර්ය බලශක්ති ඒකක සවි කිරීමට අපේක්ෂිත පෞද්ගලික නිවාස ඒකක<br>උපරිම ණය මුදල (රු.) - 350,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75% |

| ණය යෝජනා ක්‍රමයේ නම | විස්තරය |
|---|---|
| 1.5 දිරි සවිය | ප්‍රතිලාභීන් - කුකුළු මස් නිෂ්පාදකයින්, ස්වයංරැකියාලාභීන්<br>උපරිම ණය මුදල (රු.) - 50,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 100%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 0% |
| 1.6 ජය ඉසුර | **පළමු කාණ්ඩය**<br>ප්‍රතිලාභීන් - වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10 ත් රු. මිලියන 250 ක් අතර හා සේවක සංඛ්‍යාව 10 ත් 50 ත් අතර කෘෂිකාර්මික වන ධීවර, විසිතුරු මත්ස්‍ය වගාව, පශු සම්පත්, විසිතුරු මල් වගාව, ගෙවතු වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ, සංචාරක, අත්කම්, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, නිෂ්පාදන කර්මාන්ත, සහ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනයේ හි නියැලෙන සුළු පරිමාණ ව්‍යවසායකයින්<br>උපරිම ණය මුදල (රු.) - 100,000,000 (අපනයන)<br>50,000,000 (අපනයන නොවන)<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75%<br><br>**දෙවන කාණ්ඩය**<br>ප්‍රතිලාභීන් - වාර්ෂික පිරිවැටුම රු. මිලයන 250 ත් රු. මිලියන 750 ත් අතර හා සේවක සංඛ්‍යාව 51 ත් 300 ත් අතර වන කෘෂිකාර්මික, ධීවර, පශු සම්පත්, විසිතුරු මල් වගාව, ගෙවතු වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ, සංචාරක, අත්කම්, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ හෝ නිෂ්පාදන කර්මාන්තයන්හි නියැලෙන මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්<br>උපරිම ණය මුදල (රු.) - 400,000,000 (අපනයන)<br>200,000,000 (අපනයන නොවන)<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 25%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 10.12% |
| 1.7 සොඳුරු පියස | ප්‍රතිලාභීන් - වර්ග අඩි 1,000 ට අඩු බිම් ප්‍රමාණ ඇති නිවාස ඒකක<br>උපරිම ණය මුදල (රු.) - 200,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75% |
| 1.8 මාධ්‍ය අරුණ | **පළමු කාණ්ඩය (නව මාධ්‍ය උපකරණ මිල දී ගැනීමට)**<br>ප්‍රතිලාභීන් - ලියාපදිංචි මාධ්‍යවේදීන්<br>උපරිම ණය මුදල (රු.) - 300,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 100%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 0%<br><br>**දෙවන කාණ්ඩය (තිබෙන මාධ්‍ය උපකරණ වැඩි දියුණු කර ගැනීමට)**<br>ප්‍රතිලාභීන් - ලියාපදිංචි මාධ්‍යවේදීන්<br>උපරිම ණය මුදල (රු.) - 150,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75% |

| ණය යෝජනා ක්‍රමයේ නම | විස්තරය |
|---|---|
| 1.9 "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් - තරුණ උපාධිධාරීන්<br>උපරිම ණය මුදල (රු.) - 1,500,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 12%<br>සහනාධාර පොලී අනුපාතය - 100%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 0%<br>වෙනත් පහසුකම් - රජයේ පූර්ණ වගකීම |
| 1.10 හරිත ණය | **<u>පළමු කාණ්ඩය</u>**<br>ප්‍රතිලාභීන් - දිරාපත් වන අමුද්‍රව්‍ය යොදා ගනිමින් ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නන්, කුඩා පරිමාණ හෝටල් හිමියන්, කාබනික පොහොර නිපදවන්නන්, ත්‍රීවීල් වාහන හිමියන්<br>උපරිම ණය මුදල (රු.) - 1,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - 50%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75%<br><br>**<u>දෙවන කාණ්ඩය - "සත්කාරක නිවාස" (Homestay) වැඩසටහන</u>**<br>ප්‍රතිලාභීන් - සංචාරක සේවා සපයන සුළු පරිමාණ හෝටල් හිමියන්<br>උපරිම ණය මුදල (රු.) - 5,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 13.5%<br>සහනාධාර පොලී අනුපාතය - සියයට 50 වැඩි<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6% |
| 1.11 මධ්‍යම ආදායම්ලාභී නිවාස ණය යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් - නවීන පන්නයේ නිවසක් මිල දී ගැනීමට අපේක්ෂිත මධ්‍යම ආදායම්ලාභී තරුණ තරුණියන්<br>උපරිම ණය මුදල (රු.) - 5,000,000<br>වාර්ෂික සඵල පොලී අනුපාතිකය - 12%<br>සහනාධාර පොලී අනුපාතය - 40%<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 7% (සහනාධාරය ගෙවනු ලබන්නේ පළමු වසර 5 සඳහා පමණි.) |
| **2. විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන ණය වැඩසටහන්** | |
| 2.1 වහලය මත සවි කරන ලද සූර්යබල ශක්ති උත්පාදන වැඩසටහන (ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදනය කෙරේ) | **<u>පළමු කාණ්ඩය</u>**<br>ප්‍රතිලාභීන් - පෞද්ගලික නිවාස<br>උපරිම ණය මුදල (රු.) - 7,500,000<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 8%<br><br>**<u>දෙවන කාණ්ඩය</u>**<br>ප්‍රතිලාභීන් - ව්‍යවසායකයින්<br>උපරිම ණය මුදල (රු.) - අවම 7,500,000 (උපරිම සීමාවක් නැත.)<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 8%<br>විදේශ ණය ආධාර සපයන ආයතනය - ආසියානු සංවර්ධන බැංකුව (පළමු වාරය සඳහා ඇ.ඩො. මිලියන 50 ක් සහ ප්‍රගතිය මත ඇ.ඩො. මිලියන 200 ක් දක්වා ඉහළ නැංවීම) |
| 2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELoC) | ප්‍රතිලාභීන් - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්<br>උපරිම ණය මුදල (රු.) - 50,000,000<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 11 - 14 %<br>විදේශ ණය ආධාර සපයන ආයතනය - ආසියානු සංවර්ධන බැංකුව (ඇ.ඩො. මිලියන 175) |
| 2.3 පවිත්‍ර ගංගා | ප්‍රතිලාභීන් - දැනටමත් කැළණි ගඟට හා කලපුවලට අපද්‍රව්‍ය බැහැර කරනු ලබන සමාගම්<br>උපරිම ණය මුදල (රු.) - 30,000,000<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.5%<br>විදේශ ණය ආධාර සපයන ආයතනය - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |

| ණය යෝජනා ක්‍රමයේ නම | විස්තරය |
|---|---|
| **3. මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් සලසන වැඩසටහන්** | |
| 3.1 ජාතික ණය සුරැකුම් ආයතනය (NCGI) | ප්‍රතිලාභීන් - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්<br>උපරිම ණය සීමාව - මුළු ණය මුදලෙන් 1/3 ක්<br>වාර්ෂික වාරිකය - 1 - 2 %<br>විදේශ ණය ආධාර සපයන ආයතනය - ආසියානු සංවර්ධන බැංකුව (ඇ.ඩො. මිලියන 100) |
| 3.2 කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන පිහිටුවීම සඳහා සහාය වීම | ප්‍රතිලාභීන් - තරුණ තරුණියන්, කාන්තාවන්, ගොවීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් පිහිටුවීමට කැමති පුද්ගලයින්<br>මූල්‍ය නොවන ප්‍රතිලාභ - සමාගම් සංස්ථාගත කිරීම සඳහා තාක්ෂණික සහාය, පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම, මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා, වෙළඳපොලට පිවිසීම<br>මූල්‍යමය ප්‍රතිලාභ - රාජ්‍ය බැංකු හරහා ලීසිං පහසුකම් සහ 75% ක ලීසිං වියදම රජය විසින් ගෙවනු ඇත. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ සහනදායී ණය සපයනු ලැබේ.<br>ණයලාභීන් විසින් ගෙවිය යුතු පොලී අනුපාතය - 6.75% |

### 2.2.1 පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම

මෙම සියළු සහනදායී ණය යෝජනා ක්‍රම රාජ්‍ය හා පෞද්ගලික බැංකු හරහා ඔවුන්ගේ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අතර රජය විසින් පොලී සහනාධාර ලබා දෙයි. එම ණය යෝජනා ක්‍රම එකොළාහ (11) අතුරින්, යෝජනා ක්‍රම අටක් (08) 2017 අයවැය මඟින් හඳුන්වා දෙනු ලැබූ අතර එම ණය යෝජනා ක්‍රම 2017 වසරේ මාර්තු 31 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2018 මාර්තු 31 දින වන විට රු. මිලියන 23,885 ක් ප්‍රතිලාභීන් 9,600 ක් වෙත ලබා දී ඇත. විස්තරාත්මක ප්‍රගතිය පහත වගු අංක 2.1 හි දක්වා ඇත.

**වගුව 2.1 : 2018 මාර්තු 31 දිනට පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමවල ප්‍රගතිය**

| අනු අංකය | ණය යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබා දුන් ණය ප්‍රමාණය (රු. මිලියන) |
|---|---|---|---|
| 1 | සොඳුරු පියස | 5,862 | 1,164.70 |
| 2 | ගොවි නවෝදා | 498 | 201.60 |
| 3 | රන් අස්වැන්න | 1,275 | 3,551.20 |
| 4 | රිය ශක්ති | 537 | 1,554.90 |
| 5 | රිවි බල සවි | 390 | 134.60 |
| 6 | ජය ඉසුර | 714 | 17,181.50 |
| 7 | දිරි සවිය | 2 | 0.60 |
| 8 | මාධ්‍ය අරුණ | 322 | 96.00 |
| | **එකතුව** | **9,600** | **23,885.10** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

2018 අයවැය මඟින් දිරාපත්වන නිෂ්පාදන, සුළු පරිමාණ හෝටල් හිමියන් සහ ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂා කරන තරුණ උපාධිධාරීන්ට සහාය වීම සඳහා "හරිත ණය" හා "ඇරඹුම" නමින් ණය යෝජනා ක්‍රම දෙකක් (02) හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිතීන් භාවිතය තහනම් කළ බැවින්, පොලිතීන් භාවිතය වෙනුවට දිරාපත්වන අමුද්‍රව්‍ය යොදා ගෙන ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන දේශීය ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා "හරිත ණය" සහනදායී ණය යෝජනා ක්‍රමය යෝජනා කරන ලද අතර එමඟින් පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අධෛර්යමත් කර පරිසර දූෂණය අවම කිරීමට අපේක්ෂා කෙරේ. තවදුරටත්, සංචාරකයන් සඳහා සේවා සපයන කුඩා පරිමාණ හෝටල් හිමියන් හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ යටතේ ලියාපදිංචි වී සිටින නිවාස හිමියන්ට තම නිවාස අදාළ ප්‍රමිතීන්ට අනුව වැඩි දියුණු කිරීමෙන් "සත්කාරක නිවාස" වැඩසටහන යටතේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මඟින් ණය පහසුකම් ලබාගත හැක.

රජයේ ඇප ආවරණයක් මත ශූන්‍ය පොලී අනුපාතයක් යටතේ මුදල් ප්‍රවාහය මත පදනම් වූ ණයක් ලබා දී තම නව ව්‍යාපාරික අදහස් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කිරීම තුළින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ප්‍රවේශ වීමට තරුණ උපාධිධාරීන් උනන්දු කිරීම සඳහා "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

2018 වසර තුළ මෙම පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම යටතේ ලබා දෙන ණය සඳහා අදාළ සහනාධාර ගෙවීමට රජය විසින් රු. මිලියන 5,810 ක් වෙන් කර ඇත. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පොලී සහනාධාර වෙනුවෙන් වෙන් කරන ලද මුළු මුදල උපයෝජනය කළහොත් 2018 වසර තුළ (වගු අංක 2.2) රු. මිලියන 73,650 ක් වටිනා ණය ප්‍රමාණයක් ලබා දීමේ හැකියාව පවතී.

**වගුව 2.2 : පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම යටතේ ණය ලබා දීමේ හැකියාව - 2018**

| අනු අංකය | ණය යෝජනා ක්‍රමය | 2018 අයවැය මඟින් වෙන් කරන ලද සහනාධාර මුදල (රු. මිලියන) | 2018 වර්ෂයේ දී ලබා දිය හැකි ණයවල උපරිම වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|
| 1 | සොඳුරු පියස | 1,000 | 14,000 |
| 2 | ගොවි නවෝදා | 50 | 350 |
| 3 | රන් අස්වැන්න | 925 | 11,000 |
| 4 | රිය ශක්ති | 150 | 1,000 |
| 5 | රිවි බල සවි | 1,500 | 22,000 |
| 6 | ජය ඉසුර | 1,500 | 13,500 |
| 7 | දිරි සවිය | 75 | 600 |
| 8 | මාධ්‍ය අරුණ | 25 | 150 |
| 9 | හරිත ණය | 60 | 850 |
| 10 | ඇරඹුම | 25 | 200 |
| 11 | මධ්‍යමපාන්තික අදායම්ලාභීන් සඳහා නිවාස | 500 | 10,000 |
| | **එකතුව** | **5,810** | **73,650** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 2.2.2 විදේශ මූල්‍ය පහසුකම් මත ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම

ඊ - ෆ්‍රෙන්ඩ්ස් චක්‍රීය අරමුදල් (පවිත්‍ර ගංගා) වැඩසටහන, නිවාසවල වහලය මත සූර්යබල උත්පාදන පද්ධති ස්ථාපිත කිරීමේ ණය ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යන විදේශාධාර ණය යෝජනා ක්‍රම තුන (03) "එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහනට අයත් වේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය, මුදල් අමාත්‍යාංශය හා ආසියානු සංවර්ධන බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වැඩි අරමුදල් ප්‍රමාණයක් ලබා දීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව විසින් පළමු වාරිකය ලෙස ලබා දුන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 යොදා ගනිමින් ආරම්භ කරන ලදී. විශේෂයෙන්ම, ප්‍රථමවරට බැංකු ණයක් ලබා ගන්නා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, කාන්තාවන් විසින් පවත්වා ගෙන යනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ණය ලබා දීම දිරිමත් කිරීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් පෙළඹවීමක් ඇති කරයි.

සමස්තයක් ලෙස, ණය ලබා දීම වේගවත්ව සිදු වී ඇති අතර 2017 වසර අවසාන වන විට සමස්ත වෙන් කළ මුදලින් සියයට 100 කට ආසන්න ප්‍රමාණයක් සහභාගීත්ව මූල්‍ය ආයතන අතර බෙදා හැර ඇති අතර 2018 මාර්තු මස වන විට සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව, 2018 මාර්තු 31 දින වන විට ප්‍රතිලාභීන් 1,611 ක් අතර රු. මිලියන 14,186.40 ක් මුදලක් ණය වශයෙන් ලබා දී ඇත. මූල්‍ය ආයතනවල ප්‍රගතිය පහත 2.3 වගුවේ දක්වා ඇත.

**වගුව 2.3 : 2018 මාර්තු 31 දිනට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| සහභාගීත්ව මූල්‍ය ආයතනය | වෙන් කරන ලද මුදල (රු. මිලියන) | උපයෝජනය | | උපයෝජිත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ණය සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රු. මිලියන) | |
| ලංකා බැංකුව | 1,280.32 | 204 | 1,201.82 | 93.9 |
| මහජන බැංකුව | 1,280.32 | 117 | 858.27 | 67.0 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,280.32 | 472 | 1,164.42 | 90.9 |

| | | | | |
|---|---|---|---|---|
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 1,905.31 | 152 | 1,905.31 | 100.0 |
| සම්පත් බැංකුව | 1,265.69 | 70 | 1,183.47 | 93.5 |
| හැටන් නැෂනල් බැංකුව | 1,905.31 | 156 | 1,905.31 | 100.0 |
| කොමර්ෂල් බැංකුව | 1,280.32 | 83 | 1,280.32 | 100.0 |
| ජාතික සංවර්ධන බැංකුව | 3,102.15 | 261 | 3,007.84 | 97.0 |
| සෙලාන් බැංකුව | 639.62 | 40 | 639.62 | 100.0 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 1,280.32 | 56 | 1,040.02 | 81.2 |
| **එකතුව** | **15,219.68** | **1,611** | **14,186.40** | **93.21** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

වෙන් කරන ලද මුදලින් සියයට 93 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත ලබා දී ඇති අතර එමඟින් සෘජු හා වක්‍ර රැකියා 15,000 කට වැඩි ප්‍රමාණයක් උත්පාදනය කර ඇත. තවමත් මූල්‍ය වෙළඳපොලේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සඳහා පවතින ඉල්ලුම හා සැපයුම අතර විශාල පරතරයක් පැවති හා බහුතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රමාණයක් ශ්‍රම සූක්ෂම වීමත් නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ සේවා නියුක්ති අවස්ථා ඇති කිරීමේ වැඩි විභවතාවයක් පවතී.

මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, රජය ආසියානු සංවර්ධන බැංකුව සමඟ තවදුරටත් සාකච්ඡා කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව 2018 - 2019 කාලපරිච්ඡේදය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවයාස ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 75 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබා දීමට එකඟ වන ලදී. ඒ අනුව, මෙම ඇ.එ.ජ. ඩොලර් මිලියන 75 ක අතිරේක ප්‍රතිපාදනය ඇ.එ.ජ. ඩොලර් මිලියන 25 ක් බැගින් වන අර්ධ වාර්ෂික ප්‍රතිපාදන තුනක් (03) ලෙස මෙම ණය යෝජනා ක්‍රමයේ පළමු අදියර සඳහා සහභාගී වූ සහභාගීත්ව මූල්‍ය ආයතන හරහාම ලබා දීමට සැලසුම් කර ඇත.

රට තුළ පුනර්ජනනීය බලශක්ති භාවිතය ආරම්භක අවධියේ පවතින බැවින් අපගේ බලශක්ති අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා සම්පූර්ණයෙන්ම ගල් අඟුරු, තෙල් හා ගෑස් මත යැපීමට සිදුවේ. වර්තමානයේ පවතින ඉල්ලුමේ අනුපාතයෙන් පොසිල ඉන්ධන අඛණ්ඩව භාවිත කරන්නේ නම්, දැනට පවත්නා පොසිල ඉන්ධන සංචිත ප්‍රමාණවත් වනුයේ වසර 30 ක කාලයක් සඳහා පමණි. එමනිසා, අනාගත බලශක්ති අර්බුදය කළමණාකරණය කිරීම සඳහා ජාතියක් වශයෙන් අප පොසිල ඉන්ධනවල සිට පිරිවැය අඩු හා පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර වෙත යොමු විය යුතුය. සමකයට අංශක 35 ඇතුළත පිහිටි "හිරු රශ්මි" කලාපයේ පිහිටා ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සූර්ය බලශක්ති උත්පාදනය ප්‍රවර්ධනය කිරීමේ විශාල විභවතාවයක් පවතී.

ඒ අනුව, නිවාසවල, පූජනීය ස්ථානවල, හෝටල්වල, ව්‍යාපාරික ආයතනවල හා කර්මාන්තශාලාවල වහල මත කුඩා සූර්ය බලශක්ති බලාගාර පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් "සූර්ය බල සංග්‍රාමය" නම් රජයේ ජාතික වැඩසටහනට පහසුකම් සැලසීමට අවශ්‍ය ණය ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුව විසින් පළමු අදියරේ දී ඇ.එ.ජ. ඩොලර් 50 ක් ලබා දීමට හා 2018 වර්ෂයෙන් ආරම්භ වී ඉදිරි වසර 04 ක කාලපරිච්ඡේදය තුළ දී ණය පහසුකම් ලබා දීමේ ප්‍රගතිය සලකා බලා ඇ.එ.ජ. ඩොලර් මිලියන 200 දක්වා එම අරමුදල ඉහළ නැංවීම තුළින් වහල මත සූර්ය බලශක්ති උත්පාදන පද්ධති ස්ථාපිත කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට දැනටමත් එකඟ වී ඇත.

ඉදිරි සිව් වසර තුළ දී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සූර්ය බලශත්කි උත්පාදන ක්ෂේත්‍රය තුළ රු. මිලියන 30,000 ක් පමණ ආයෝජනය කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් සාපේක්ෂව අඩු පිරිවැය හා පරිසර හිතකාමී මෙගා වොට් 200 ක පමණ සූර්ය බලශක්තිය, ජාතික විදුලිබල පද්ධතියට එක් කරනු ලැබේ. අනෙක් අතට, වර්තමානයේ පොසිල ඉන්ධන භාවිතයෙන් උත්පාදනය කරන විදුලිය වෙනුවට මෙම ව්‍යාපෘතිය හරහා උත්පාදනය කරනු ලබන සූර්ය බලශක්තිය භාවිත කළ හැකි බැවින් ඛණිජ තෙල් ආනයන වියදම අඩු වීමෙන් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කරගත හැක.

ජල දූෂණය යනු කර්මාන්තශාලා හිමියන් හා පොදු මහජනතාව විසින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී, අනුගමනය කරනු ලෙස අයහපත් පුරුදු හා ඔවුන් විසින් සිදු කරන අක්‍රමිකතාවන් නිසා ඇති වන ප්‍රධාන පාරිසරික ගැටළුවලින් එකකි. කර්මාන්තශාලා හිමියන් හා කර්මාන්තකරුවන් බොහෝ දෙනෙකු පානීය ජල මූලාශ්‍ර ලෙස භාවිත කරනු ලබන ගංගා හා ධීවර කර්මාන්ත ක්ෂේත්‍රය හා ප්‍රභලව බැඳී පවතින කලපු වෙත පවතින පරිසර ආරක්ෂණ නීති උල්ලංඝණය කරමින් සෘජුවම අපද්‍රව්‍ය බැහැර කරනු ලබයි. ඒ අනුව, අපගේ ඇතැම් ජලමාර්ගවල දූෂිත මට්ටම පෙර නොවූ විරූ මට්ටමකට ළඟා වී ඇත. ඒ අනුව, ඉදිරි වසර 05 තුළ දී කර්මාන්තශාලා හා සංචාරක හෝටල් මඟින් ගංගා, කලපු, සහ මෝය වෙත මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය ශූන්‍ය කිරීමේ අරමුණින් "ඊ - ෆ්‍රෙන්ඩ්ස්" ව්‍යාපෘතිය යටතේ සහනදායී මූල්‍යාධාර මත "පවිත්‍ර ගංගා" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

### 2.2.3 මූල්‍ය නොවන පහසුකම් ලබා දීමේ වැඩසටහන්

ජාතික ණය සුරැකුම් ආයතනය (National Credit Guarantee Institution) හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් (SME Companies) පිහිටුවීම වෙනුවෙන් මූල්‍යමය මෙන්ම මූල්‍යමය නොවන පහසුකම්වලින් සමන්විත වැඩසටහන් 2 ක් වේ.

බැංකු විසින් ඇප සුරැකුම් මත පදනම්ව ණය ලබා දීම කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වීම නිසා මූල්‍ය සඳහා ප්‍රවේශ වීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී ඇත. බොහොමයක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඇපකර ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත. මෙවැනි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඉතිරි වී ඇත්තේ ණය ගැනීම හා ඒ තුළින් ලඟා කර ගත හැකි ව්‍යාපාරික වර්ධනය අත්හැර දැමීම, ඉහළ පොලී අනුපාත යටතේ මුදල් ණයට ලබා දෙන්නන් හෝ ණය සඳහා අදාළ නොවන තමා සතු නිශ්චල දේපල හෝ රත්‍රන් ආදිය ණය සඳහා ඇපකර වශයෙන් ඉදිරිපත් කිරීම වැනි දුෂ්කර විකල්පයක්ය. මෙම ගැටළු විසඳීම සඳහා බොහෝ රටවල් විසින් අනුගමනය කර ඇති ප්‍රධාන ක්‍රියාමාර්ගය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ණය සුරැකුම් යෝජනා ක්‍රම නිර්මාණය කිරීමයි. අවධානම දරා ගැනීම/බෙදා ගැනීම සහ ඇප සුරැකුම් මත යැපීම අඩු කිරීම මඟින් මෙවැනි යෝජනා ක්‍රම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත වඩාත් තරඟකාරී පොලී අනුපාත යටතේ වැඩි ණය ප්‍රමාණයක් සැපයීමට මූල්‍ය ආයතන දිරිමත් කරනු ලැබේ.

ඒ අනුව, රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ජාතික ඇප සුරැකුම් ආයතනය පිහිටුවීමට යෝජනා කරන ලදී. මේ සම්බන්ධ මූලික සාකච්ඡාවක් ආසියානු සංවර්ධන බැංකුව සමඟ පවත්වන ලද අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් යෝජිත ජාතික ඇප සුරැකුම් ආයතනයේ මූලික ප්‍රාග්ධනයක් ලෙස ලබා දීමට එකඟ වන ලදී. ඊට සමගාමීව, ණය සුරැකුම් සඳහා පවතින වෙළෙඳපොල ඉල්ලුම පිළිබඳව විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා තාක්ෂණික සහාය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන අතර අදාළ විශ්ලේෂණයේ සොයා ගැනීම් මත පදනම්ව යෝජිත ජාතික ඇප සුරැකුම් ආයතනයේ තිරසාරභාවය සඳහා මෙම ආයතනය සමාගම් පනත යටතේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයක් (Public Private Partnership) ලෙස පිහිටුවීමට නිර්දේශ කර ඇත. එසේම, රජය විසින් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ලෙස රු. මිලියන 500 ක් වෙන් කර ඇත.

වසර 2018 - 2020 කාලපරිච්ඡේදය තුළ දී රජය විසින් නව කෘෂි හා ධීවර ව්‍යාපාර ආයතන 50 ක්, කාන්තාවන්ට වැඩි හිමිකාරිත්වය ඇති ව්‍යාපාර ආයතන 25 ක් සහ තරුණ තරුණියන් විසින් ආරම්භ කරන ව්‍යාපාර ආයතන 150 ක් පිහිටුවීමට අපේක්ෂා කරයි. මෙම ව්‍යාපාර ආයතන සමාගම් පනත යටතේ සමාගම් ලෙස හෝ නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ලෙස හෝ ගොවි සංවිධාන වශයෙන් පිහිටුවනු ඇත. අවම වශයෙන් කොටස් හිමියන් දස (10) දෙනෙකු මෙම සමාගම් හෝ අනෙකුත් ආයතන තුළ සිටිය යුතු අතර සෑම කොටස් හිමියෙකුම ආයතනයේ මූලික ප්‍රාග්ධනය සඳහා දායක විය යුතුය. ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන (German International Cooperation – GIZ) මෙම කර්තව්‍යයේ උපදේශකයන් ලෙස තෝරා ගෙන ඇති අතර මෙම වැඩසටහන යටතේ පිහිටුවීමට අපේක්ෂා කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් සඳහා ඔවුන් විසින් අවශ්‍ය තාක්ෂණික සහාය සපයනු ලැබේ. මෙම සමාගම් සඳහා "එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රම" හරහා ප්‍රදාන හා ණය ඇතුළු පුළුල් මූල්‍ය පහසුකම් පැකේජයක් ලබා දීමට රජය සැලසුම් කර ඇත.

### 2.2.4 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍යනයේ ප්‍රගතිය

“එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා” වැඩසටහන යටතේ, රජයේ මැදිහත්වීමෙන් සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් සපයමින් රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා සහාය වීමේ අරමුණින් ණය යෝජනා ක්‍රම දාසයක් (16) ක්‍රියාත්මක වේ. ඊට අමතරව, තම බැංකු අරමුදල් උපයෝගි කර ගනිමින් පවතින වෙළෙඳපොල පොලී අනුපාතයටත් ණය ලබා දෙන ණය යෝජනා ක්‍රම 60 කට අධික සංඛ්‍යාවක් රාජ්‍ය හා පෞද්ගලික අංශවල වාණිජ හා විශේෂිත බැංකු විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම සියළු ණය යෝජනා ක්‍රම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා සහාය වීමට යොමු වී ඇති බැවින්, බැංකු අතර සමානතාවය වර්ධනය කිරීම සඳහා “එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා” තේමාව යටතේ මෙම ණය යෝජනා ක්‍රම සියල්ල ප්‍රවර්ධනය කිරීමට තීරණය කර ඇත. 2017 වසරේ දී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු විසින් මෙම සියළු ණය යෝජනා ක්‍රම හරහා ආසන්න වශයෙන් රු. මිලියන 546,024 ක මුදලක් ලබා දී ඇත.

**වගුව 2.4 : වාණිජ හා සංවර්ධන බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබා දුන් ණය - 2017**

| බැංකුව | කෘෂිකාර්මික | | සේවා | | කර්මාන්ත | | වෙනත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) |
| ලංකා බැංකුව | 131 | 544 | 745 | 3,832 | 1,663 | 6,724 | 1,563 | 1,210 | 4,102 | 12,310 |
| මහජන බැංකුව | 979 | 2,754 | 297 | 1,001 | 984 | 2,459 | 2,517 | 5,982 | 4,777 | 12,195 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 3,552 | 4,271 | 174 | 288 | 7,560 | 10,081 | 11,818 | 11,697 | 23,104 | 26,337 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 13 | 76 | 29 | 95 | 53 | 231 | 5 | 21 | 100 | 423 |
| සණස සංවර්ධන බැංකුව | 116 | 89 | 6 | 4 | 1,622 | 1,319 | 9,131 | 7,398 | 10,875 | 8,810 |
| ජාතික සංවර්ධන බැංකුව | 305 | 109 | 124 | 46 | 185 | 65 | 392 | 140 | 1,006 | 360 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 309 | 3,321 | 1,561 | 10,929 | 1,178 | 8,762 | 172 | 654 | 3,220 | 23,666 |
| කොමර්ෂල් බැංකුව | 6,780 | 6,955 | 2,098 | 9,196 | 5,782 | 25,503 | 38,988 | 90,227 | 53,648 | 131,881 |
| සම්පත් බැංකුව | 312 | 14,084 | 218 | 14,943 | 551 | 31,151 | 1,419 | 75,618 | 2,500 | 135,797 |
| සෙලාන් බැංකුව | 595 | 6,364 | 670 | 6,449 | 1,275 | 10,112 | 2,699 | 12,856 | 5,239 | 35,781 |
| හැටන් නැෂනල් බැංකුව | 3,668 | 13,590 | 5,345 | 28,100 | 6,741 | 32,600 | 12,665 | 62100 | 28,419 | 136,390 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 113 | 1,213 | 23 | 338 | 348 | 2,242 | 952 | 7,449 | 1,436 | 11,242 |
| ස්ටැන්ඩර් චාර්ටඩ් බැංකුව | 1 | 46 | 42 | 503 | 46 | 395 | 1 | 2 | 90 | 946 |
| පැන් ඒෂියා බැංකුව | 197 | 594 | 96 | 384 | 1,773 | 7,934 | 902 | 974 | 2,968 | 9,886 |
| **එකතුව** | **17,071** | **54,010** | **11,428** | **76,108** | **29,761** | **139,578** | **83,224** | **276,328** | **141,484** | **546,024** |

මූලාශ්‍රය : අදාළ බැංකු

2017 වසරේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශවල වාණිජ හා සංවර්ධන බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 12 ක් කෘෂිකාර්මික අංශය සඳහා ද, සියයට 21 ක් කර්මාන්ත අංශය සඳහා ද, සියයට 8 ක් සේවා අංශය සඳහා ද ලබා දී ඇති අතර සියයට 59 ක් අනෙකුත් සියළුම ක්ෂේත්‍රවලට අදාළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබා දී ඇත.

### 2.2.5 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යූරෝ මිලියන 2.785 ක මූල්‍ය ප්‍රදානයක් හරහා ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (GIZ) ලබා දෙමින් ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ශ්‍රී ලංකා රජය අතර තාක්ෂණික සහයෝගිතා ගිවිසුමක් 2012 දී අත්සන් කරන ලදී. "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - II" යනුවෙන් හැඳින්වෙන එහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාලසීමාව 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලද අතර ජර්මානු ප්‍රදාන ලෙස අතිරේක යූරෝ මිලියන 3 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු වියදම් සඳහා රු. මිලියන 20 ක් 2018 අයවැය මඟින් වෙන් කර ඇත.

ප්‍රගති වාර්තා අනුව, 2017 වසර තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 286 ක පමණ මුදලක් ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් වැය කර ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ දෙවන අදියරේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සහ අනෙකුත් සංවර්ධන පසුගාමී ප්‍රදේශවල පිහිටා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල තරඟකාරීත්වය, සියළු පාර්ශවයන්ගේ අන්තර්ගතභාවය සහ පාරිසරික තිරසාරභාවය ඉහළ නැංවීමයි. මෙම වැඩසටහන ක්ෂේත්‍ර හතරකින් (04) සමන්විත වේ;

1) ප්‍රතිපත්ති හා ආයතනික රාමු කොන්දේසි
2) මූල්‍ය සඳහා වූ ප්‍රවේශය
3) තාක්ෂණය හා වෙළඳපොල ප්‍රවේශය
4) නව සොයා ගැනීම් හා ව්‍යවසායකත්වය

## 2.3 ක්ෂුද්‍රමූල්‍යනය

රටේ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධන කිරීමෙහිලා සුවිශේෂි කාර්යභාරයක් ක්ෂුද්‍රමූල්‍යනය සිදු කරනු ලබයි. මෙහිදී දිළිඳු මෙන්ම සමාජයේ නොසලකා හැර ඇති පුද්ගලයන් සඳහා වඩා සුභදායී වටපිටාවක් ගොඩ නගා දීම සඳහා රජය විසින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. මෙසේ දිළිඳු ජනතාවගේ සාමාජීය හා ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා බොහොමයක් රටවල් හා සංවර්ධන ආයතන ක්ෂුද්‍රමූල්‍යනය මෙවලමක් ලෙස භාවිත කරනු ලබයි.

පසුගිය දශක කිහිපය තුළ ඉතිරි කිරීමේ සංවිධාන, චක්‍රීය ඉතුරුම් සමාජ, ණය දෙන ආයතන, අවමංගල්‍ය හෝ මරණ ප්‍රතිලාභ සමිති ස්වරූපයෙන් නාගරික හා ග්‍රාමීය ප්‍රජාව තුළ විවිධාකාර ඉතුරුම් හා ණය දෙන කණ්ඩායම් ලෙස ක්ෂුද්‍රමූල්‍යනය වර්ධනය වී ඇත. මෙවැනි ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් විධිමත් බැංකු පද්ධතිය මඟින් නොසලකා හරින ලද අඩු ආදායම්ලාභී ජනතාව වෙත ණය, ඉතුරුම්, රක්ෂණ, ප්‍රේෂණය හා මූල්‍ය නොවන සේවාවන් රැසක් සපයනු ලබයි. ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සපයනු ලබන මෙවැනි සේවාවන් ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභී තනි පුද්ගල කුටුම්භ හා කුඩා පරිමාණ ගෘහස්ත ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාවන් මෙන්ම ඔවුන්ගේ ආදායම් හා හැකියාවන් ඉලක්ක කරගෙන සපයනු ලබයි.

ක්ෂුද්‍රමූල්‍ය ආයතන සුපරීක්ෂණය කිරීමේ වගකීම විවිධ අධිකාරීන් වෙත පැවරී ඇතත් කිසිදු අධීක්ෂණ හෝ නියාමන අධිකාරියකට හෝ ආයතනයකට යටත් නොවූ ක්ෂුද්‍රමූල්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් පවතී. කෙසේ වෙතත්, ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයේ අරමුණු හා එයට ලබා දෙන ප්‍රමුඛතාව මත ක්ෂුද්‍රමූල්‍ය ආයතනයන් හි ක්‍රියාකාරීත්වය හා මූල්‍ය කාර්යසාධනය රඳා පවතී.

ඒ අනුව, 2016 අංක 6 දරණ ක්ෂුද්‍රමූල්‍ය පනත මඟින් මෙතෙක් කිසියම් හෝ නියාමනයකට භාජනය නොවූ ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදයකට යටත් කර ඇති අතර එය 2016 ජූලි 15 දින සිට බලාත්මක වේ. අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යාපාර කටයුතුවලට පහසුකම් සැලසීම, වැඩි දියුණු කිරීම මූල්‍යමය අන්තර්ගතභාවය ඉහළ නැංවීම, මූල්‍ය ආයතනවල ස්ථායිතාව හා පද්ධතීන් ශක්තිමත් කිරීම, ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල අරමුදල් මූලාශ්‍ර පිළිබඳ පුළුල් ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම, පාරිභෝගික රැකවරණය ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂිත ස්ථාවර මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණු වේ. මෙම පනත මඟින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරවල නිරත වන සමාගම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට, එම

සමාගම් වෙත නීති හා විධාන නිකුත් කිරීම සහ ක්ෂුද්‍රමූල්‍ය ණය රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීම සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ටාර්වරයා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

2017 වසර තුළ ක්ෂුද්‍රමූල්‍ය ආයතන සඳහා බලපත්‍ර ලබා ගැනීමට අයදුම්පත් 11 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කර තිබුණි. තවද, 2017 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්ෂුද්‍රමූල්‍ය ණය රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීම සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ටාර්වරයා වෙත මාර්ගෝපදේශ නිකුත් කර ඇත. ඒ අනුව ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ටාර්වරයා විසින් අදාළ ගැසට් පත්‍රය නිකුත් කළ යුතුවේ. ක්ෂුද්‍රමූල්‍ය පනතේ පනවා ඇති විධිවිධානයන්ට අනුව බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් හෝ ලියාපදිංචි ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයකට හැර කිසිදු ආයතනයකට ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරවල නිරතවීමේ හැකියාවක් නොමැත. මේ සඳහා ලබා දී ඇති සංක්‍රමණ කාල සීමාව 2018 ජනවාරි මස 14 දිනෙන් අවසන් වේ.


අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කරමින් රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් බොහොමයක් 2017 වසරේ දී ද ක්‍රියාත්මක වූ අතර එම ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන්වල ප්‍රගතිය 2.5 වගුවේ දැක්වේ.

**වගුව 2.5 : ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රගතිය - 2017**

| ක්ෂුද්‍රමූල්‍ය ආයතනය | ශාඛා සංඛ්‍යාව | තැන්පත්කරුවන් සංඛ්‍යාව | ණයලාභීන් සංඛ්‍යාව | මුළු තැන්පතු ප්‍රමාණය (රු. මිලියන) | මුළු ආයෝජන (රු. මිලියන) | මුළු ණය ප්‍රමාණය (රු. මිලියන) |
|---|---:|---:|---:|---:|---:|---:|
| දිවිනැගුම ප්‍රජා මූල බැංකුව | 1,074 | 14,060,141 | 1,314,357 | 87,407 | 78,068 | 54,547 |
| සමූපකාර ග්‍රාමීය බැංකුව | 2,258 | 9,868,445 | 1,347,237 | 113,387 | 111,287 | 75,281 |
| ගොවිජන බැංකුව | 551 | 697,977 | 630,806 | 680 | 2,319 | 1,452 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 268 | 6,263,479 | 576,293 | 136,582 | 36,430 | 128,343 |
| ලංකා පුත්‍ර බැංකුව | 8 | 64,530 | 8,899 | 375 | 5,361 | 3,965 |
| **එකතුව** | **4,151** | **30,954,572** | **3,877,592** | **338,431** | **228,104** | **263,588** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ණය හෝ තැන්පතු වශයෙන් මූල්‍ය පහසුකම් සපයනු ලබයි. ඒ අනුව, 2017 වර්ෂය අවසන් වන විට ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. බිලියන 263 ක් වන අතර එයින් සියයට 49 ක් (රු. බිලියන 128) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ද, සියයට 28 (රු. බිලියන 75) සමූපකාර ග්‍රාමීය බැංකු විසින් ද, සියයට 20 (රු. බිලියන 54) දිවිනැගුම ප්‍රජා මූල බැංකු විසින් ද ලබා දී ඇත. 2017 වන විට අඩු ආදායම්ලාභීන්ගේ ඉතුරුම් රු. බිලියන 338 දක්වා ඉහළ ගොස් ඇති අතර එයින් රු. බිලියන 228 ක් දිගු හා කෙටි කාලීන ආයෝජනයන් හි යොදවා ඇත.



2017 වර්ෂයේ දී වාණිජ බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති මුළු ණය මුදල රු. බිලියන 165 වන අතර එයින් රු. බිලියන 87 සම්පත් බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සඳහා වූ ණය යෝජනා ක්‍රමය, ජය ඉසුර, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර), දිළිඳුබව තුරන් කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය හා සෞභාග්‍යා යන ණය යෝජනා ක්‍රම හරහා සුළු පරිමාණ ණය ලෙස ලබා දී ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා මහජන බැංකුව 2017 වසර තුළ පිළිවෙලින් රු. බිලියන 44 හා රු. බිලියන 7 ක් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ණය ලෙස ප්‍රදානය කර ඇත. රජයේ බැංකුවලට සාපේක්ෂව පෞද්ගලික බැංකු විසින් ද විවිධ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා ණය ලබා දී ඇති අතර එයින් හැටන් නැෂනල් බැංකුව, සණස සංවර්ධන බැංකුව හා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ඉදිරියෙන් සිටී.

## 2.4 කෘෂිකර්මාන්තය

### 2.4.1 වී ගොවීන් හට පොහොර සඳහා මුදල් සහනාධාරය

රජය විසින් 2016 යල කන්නයේ සිට පොහොර සඳහා වන මුදල් සහනාධාර වැඩසටහන හඳුන්වා දෙන ලදී. ඒ අනුව, වී ගොවියෙකු සඳහා වසරකට හෙක්ටයාරයකට රු. 25,000/- බැගින් හෙක්ටයාර දෙකක උපරිමයක් දක්වා මුදල් සහනාධාරයක් පිරිනමන ලදී. හෙක්ටයාර දෙකක් හිමි සුළු පරිමාණ වී ගොවියෙකු වාර්ෂිකව රු. 50,000/- ක මුදල් සහනාධාරයක් ලැබීම සඳහා සුදුසුකම් ලබන අතර, ඔවුනට හිමි සහනාධාරය එක් එක් වසරේ කන්න දෙක සඳහා වෙන් වෙන් වශයෙන් ලබා දේ.

දීපව්‍යාප්තව ඇති රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ පොහොර අලෙවිසැල් මඟින් රසායනික පොහොර හෝ කාබනික පොහොර මිල දී ගැනීම සඳහා එකී මුදල් සහනාධාරය යොදා ගැනීමට වී ගොවීන් හට නිදහස සලසා දී ඇත. මෙකී නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසාලමින් වී වගාව සඳහා යොදා ගනු ලබන ප්‍රධාන පොහොර වර්ග තුන වන යූරියා, ට්‍රිපල් සුපර් පොස්ෆේට් (ටී.එස්.පී.) හා මියුරේට් ඔෆ් පොටෑෂ් (එම්.ඕ.පී.) කි.ග්‍රෑම් 50 ක පොහොර මිටියක් සඳහා රු. 2,500/- ක උපරිම සිල්ලර මිලක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම මුදල් සහනාධාරය අදාළ වී ගොවියාගේ බැංකු ගිණුම වෙත බැර කරනු ලබන අතර එම තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

පොහොර සහනාධාර මුදල් ලබා දීමේ වැඩසටහන යටතේ 2016/17 මහ කන්නයේ හා 2017 යල කන්නයේ වී ගොවීන් හට රු. බිලියන 10.3 ක මුදල් ප්‍රදානයන් ලබා දී ඇත. වැඩි විස්තර පහත 2.6 වගුවේ සඳහන් වේ.

**වගුව 2.6 : වී සඳහා වන පොහොර සහනාධාර මුදල් ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | 2016/17 මහ කන්නය | | | 2017 යල කන්නය | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්.) | ගෙවූ සහනාධාර මුදල (රු.) | පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්.) | ගෙවූ සහනාධාර මුදල (රු.) | පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්.) | ගෙවූ සහනාධාර මුදල (රු.) |
| කොළඹ | 4,660 | 1,753 | 22,413,750 | 5,469 | 816 | 10,473,750 | 10,129 | 2,569 | 32,887,500 |
| ගම්පහ | 14,025 | 5,331 | 70,710,000 | 7,267 | 3,118 | 40,860,000 | 21,292 | 8,449 | 111,570,000 |
| කළුතර | 14,096 | 5,226 | 65,743,500 | 14,822 | 5,920 | 75,200,500 | 28,918 | 11,146 | 140,944,000 |
| මහනුවර | 26,256 | 10,968 | 140,218,750 | 29,788 | 9,805 | 125,035,000 | 56,044 | 20,773 | 265,253,750 |
| මාතලේ | 29,965 | 14,593 | 185,515,000 | 22,236 | 9,543 | 121,728,750 | 52,201 | 24,136 | 307,243,750 |
| නුවර එළිය | 14,145 | 5,569 | 62,492,470 | 11,587 | 4,620 | 58,047,500 | 25,732 | 10,189 | 120,539,970 |
| ගාල්ල | 11,077 | 4,324 | 54,750,750 | 12,323 | 5,239 | 66,603,750 | 23,400 | 9,563 | 121,354,500 |
| මාතර | 15,934 | 6,572 | 85,536,350 | 29,157 | 11,248 | 146,481,250 | 45,091 | 17,819 | 232,017,600 |
| හම්බන්තොට | 43,057 | 34,039 | 301,867,500 | 33,625 | 25,541 | 320,178,750 | 76,682 | 59,580 | 622,046,250 |
| යාපනය | 16,295 | 9,092 | 121,509,900 | 6,759 | 2,744 | 37,672,500 | 23,054 | 11,836 | 159,182,400 |
| මන්නාරම | 14,788 | 17,286 | 216,070,000 | 258 | 149 | 1,517,500 | 15,046 | 17,435 | 217,587,500 |
| වව්නියාව | 17,551 | 18,273 | 226,838,250 | 813 | 511 | 6,381,250 | 18,364 | 18,784 | 233,219,500 |
| මුලතිව් | 12,851 | 15,587 | 194,841,250 | 1,124 | 899 | 11,241,250 | 13,975 | 16,487 | 206,082,500 |
| කිලිනොච්චිය | 15,337 | 21,150 | 264,373,750 | 2,519 | 1,620 | 20,243,750 | 17,856 | 22,769 | 284,617,500 |
| මඩකලපුව | 36,498 | 44,261 | 553,256,250 | 18,582 | 23,415 | 292,687,250 | 55,080 | 67,675 | 845,943,500 |
| අම්පාර | 74,630 | 75,438 | 942,976,250 | 46,798 | 41,148 | 514,353,750 | 121,428 | 116,586 | 1,457,330,000 |
| ත්‍රිකුණාමලය | 40,729 | 37,288 | 466,095,000 | 21,472 | 9,864 | 123,305,000 | 62,201 | 47,152 | 589,400,000 |
| කුරුණෑගල | 115,598 | 40,092 | 510,102,450 | 108,201 | 17,845 | 228,932,500 | 223,799 | 57,937 | 739,034,950 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුත්තලම | 19,605 | 15,204 | 190,403,230 | 3,259 | 2,236 | 28,435,625 | 22,864 | 17,440 | 218,838,855 |
| අනුරාධපුරය | 116,561 | 50,973 | 637,257,500 | 35,432 | 25,057 | 312,967,500 | 151,993 | 76,031 | 950,225,000 |
| පොළොන්නරුව | 66,717 | 63,674 | 709,380,125 | 57,439 | 39,160 | 489,307,750 | 124,156 | 102,834 | 1,198,687,875 |
| බදුල්ල | 48,324 | 25,044 | 315,187,250 | 50,574 | 13,881 | 177,181,250 | 98,898 | 38,924 | 492,368,500 |
| මොණරාගල | 47,313 | 30,117 | 351,599,500 | 16,533 | 10,059 | 125,883,750 | 63,846 | 40,176 | 477,483,250 |
| රත්නපුර | 19,376 | 9,382 | 118,693,750 | 15,824 | 7,324 | 92,730,000 | 35,200 | 16,705 | 211,423,750 |
| කෑගල්ල | 11,149 | 3,142 | 43,445,000 | 7,070 | 1,832 | 25,616,250 | 18,219 | 4,974 | 69,061,250 |
| **එකතුව** | **846,537** | **564,377** | **6,851,277,525** | **558,931** | **273,594** | **3,453,066,125** | **1,405,468** | **837,971** | **10,304,343,650** |

මූලාශ්‍රය : කෘෂිකර්ම අමාත්‍යාංශය

### 2.4.2 වී හැර අනෙකුත් බෝග පොහොර සඳහා මුදල් සහනාධාරය

සුළු පරිමාණ ගොවීන් දිරි ගැන්වීමක් වශයෙන් වී හැර අනෙකුත් බෝගයන්හි නිෂ්පාදන වියදම අවම කිරීම හා ඒවායේ ඵලදායීතාවය නංවාලීම පිණිස රජය විසින් සුළු පරිමාණ වැවිලි බෝග හිමියන් හා බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූණු හා මිරිස් වගා කරනු ලබන සුළු පරිමාණ ගොවීන් හට පොහොර සඳහා මුදල් සහනාධාර ලබා දීමේ වැඩසටහන දියත් කරන ලදී. රජයේ ප්‍රතිපත්ති මූලාරම්භයක් වන "ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන" හා සමගාමීව ඉහත බෝග වර්ග පහ හඳුනාගෙන ඇත. වී හැර අනෙකුත් බෝග සඳහා ක්‍රියාත්මක වාර්ෂික පොහොර සහනාධාර මුදල් ප්‍රමාණයන් 2.7 වගුවේ දැක්වේ.

**වගුව 2.7 : වී හැර අනෙකුත් බෝග සඳහා ක්‍රියාත්මක පොහොර සහනාධාර මුදල් ප්‍රමාණ**

| බෝගය | මුදල් සහනාධාරය ලැබීම සඳහා හිමිකම් ලබන උපරිම භූමි ප්‍රමාණය (හෙක්.) | වාර්ෂිකව ගෙවනු ලබන මුදල් සහනාධාරය (රු.) |
|---|---|---|
| තේ | 01 | 15,000 |
| රබර් | 02 | 5,000 |
| පොල් | 02 | 9,000 |
| බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූණු හා මිරිස් | 01 | 10,000 |

මූලාශ්‍රය : කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2017 වසරේ දී වැවිලි අංශයේ සුළු වගාකරුවන් 351,885 ක් පමණ මුදල් සහනාධාර ලබා ඇත.

**වගුව 2.8 : වැවිලි බෝග සඳහා පොහොර සහනාධාර මුදල් ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය**

| වැවිලි බෝගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.) | ගෙවූ සහනාධාර මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| තේ | 139,211 | 59,304 | 886 |
| රබර් | 41,819 | 19,110 | 95 |
| පොල් | 170,855 | 53,571 | 480 |
| **එකතුව** | **351,885** | **131,986** | **1,461** |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2017 වසරේ දී බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූණු හා මිරිස් වගා කරනු ලබන කුඩා ගොවීන් 89,603 ක් පමණ මෙසේ මුදල් සහනාධාරය ලබා තිබේ.

**වගුව 2.9 : අනෙකුත් බෝග සඳහා පොහොර සහනාධාර මුදල් ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය**

| පළාත | පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.) | ගෙවූ සහනාධාර මුදල (රු.) |
|---|---|---|---|
| බස්නාහිර | - | - | - |
| මධ්‍යම | 2,852 | 941.63 | 9,482,000 |
| දකුණ | 452 | 158.45 | 1,586,000 |
| වයඹ | 1,613 | 915.45 | 9,155,000 |
| උතුරු මැද | 26,022 | 19,075.00 | 190,754,000 |
| ඌව | 37,531 | 28,040.00 | 280,600,000 |
| සබරගමුව | 179 | 63.00 | 627,000 |
| නැගෙනහිර | 7,200 | 5,756.00 | 56,808,074 |
| උතුර | 13,754 | 4,485.00 | 48,349,000 |
| **එකතුව** | **89,603** | **59,434.53** | **597,361,074** |

මූලාශ්‍රය : කෘෂිකර්ම අමාත්‍යාංශය

### 2.4.3 නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

කෘෂිකාර්මික අංශයට ණය පහසුකම් සපයමින් ග්‍රාමීය අංශයේ නිෂ්පාදනය දිරි ගන්වමින් හා එම ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් වී හා අනෙකුත් බෝග වගා කිරීම සඳහා ගොවීන්ට ණය ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හරහා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය 2017 වසරේ දී ද ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් සිය අරමුදල් උපයෝගි කරගනිමින් වී, මිරිස්, ලූණු, බඩඉරිගු, අර්තාපල්, ඉගුරු හා එළවළු ඇතුළුව බෝග වර්ග 32 ක් සඳහා ණය ප්‍රදානය කරනු ලබයි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය දිළිඳුකම පිටුදැකීම ග්‍රාමීය ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා මහඟු පිටුවහලක් ලබා දුනි. ඒ අනුව, වගා කටයුතු සඳහා ගොවීන්ට සියයට 7 ක පොලී අනුපාතයකට ණය ලබා දෙන අතර ඒ සඳහා සියයට 5 ක පොලී සහනාධාරයක් ද රජය විසින් ලබා දෙයි.

| වගුව 2.10 : නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් වගා ණයවල සමස්ත ප්‍රගතිය, 2013 - 2017 | | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| නිකුත් කරන ලද ණයවල වටිනාකම (රු. මිලියන) | 8,189 | 6,750 | 7,138 | 8,009 | 7,846 |
| වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය (අක්කර) | 279,521 | 240,921 | 265,719 | 274,997 | 236,139 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 96,381 | 86,143 | 90,533 | 87,060 | 71,397 |

මූලාශ්‍රය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සහභාගීත්ව මූල්‍ය ආයතන සිය අරමුදල් යොදා ගනිමින් 2017 වසරේ දී ත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දුන් අතර ඒ සඳහා රජය විසින් රු. මිලියන 219 ක් පොලී සහනාධාර ලෙස ගෙවා ඇත. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මඟින් 2017 වසර තුළ දී ප්‍රතිලාභීන් 71,397 ක් සඳහා රු. මිලියන 7,846 ක මුදලක් ණය වශයෙන් ලබා දී ඇත. පසුගිය වසර 5 පුරා මෙම ණය යෝජනා ක්‍රමය මගින් ලබා දුන් ණය ප්‍රමාණයේ උච්ඡාවචනයක් සිදු වී තිබුණත් වසරකට රු. බිලියන 8 ක පමණ ණය නිදහස් කර ඇත. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 2016 වසර හා සැසඳීමේ දී 2017 වසරේ දී 87,060 සිට 71,397 දක්වා අඩු වී ඇති අතර ණය ප්‍රදානයන් රු. මිලියන 8,009 සිට රු. මිලියන 7,845 දක්වා අඩු වී ඇත. ඒ අනුව, පසුගිය වසර හා සැසඳීමේ දී ණය සඳහා ඉල්ලුම සියයට 18 කින් අඩු වී ඇත. 2017 වර්ෂයේ දී රටේ පැවති අයහපත් දේශගුණික හා පාරිසරික බලපෑම මෙම ණය ඉල්ලුම අඩු වීමට ප්‍රධාන ලෙස හේතු විය.

ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය අනුව, අක්කරයකට රු. 320,000 ක උපරිමයකට යටත්ව වී වගාකරුවන්ට වැඩිම ණය ප්‍රමාණයක් නිදහස් කර ඇති අතර එය 2017 වසර තුළ ප්‍රදානිත ණය ප්‍රමාණයෙන් සියයට 65 කි. 2017 වසර තුළ මෙම ණය පහසුකම් යටතේ අක්කර 236,139 ක කෘෂි බෝග වගා කර ඇති අතර එයින් සියයට 76 ක් වී වගාව සඳහා යොදා ගෙන ඇත.


| වගුව 2.11 : නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය - 2017 | | | | | |
|---|---|---|---|---|---|
| වැවිලි බෝගය | අක්කරයකට දෙනු ලබන උපරිම ණය සීමාව (රු.) | උපරිම භූමි ප්‍රමාණය (අක්කර) | ප්‍රදානිත ණය සංඛ්‍යාව | ප්‍රදානිත ණය මුදල (රු. මිලියන) | භූමි වපසරිය (අක්කර) |
| වී - වාරිමාර්ග | 30,000 | 10 | 46,135 | 4,743 | 178,770 |
| වර්ෂා පෝෂිත | 32,000 | 10 | | | |
| බඩඉරිගු | 34,000 | 10 | 10,395 | 1,062 | 36,497 |
| අර්තාපල් | 252,000 | 2 | 3,358 | 724 | 3,529 |
| ලූනු | 140,000 | 2 | 3,541 | 556 | 5,281 |
| මිරිස් | 88,000 | 2 | 2,055 | 155 | 2,236 |
| එළවළු | 31,000 - 119,000 | 2 | 4,788 | 531 | 7,617 |
| වෙනත් - ඉගුරු | 70,000 | 2 | 1,125 | 75 | 2,210 |
| **එකතුව** | | | **71,397** | **7,846** | **236,139** |

මූලාශ්‍රය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2017 වසර තුළ ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය හා ප්‍රතිලාභීන්ගේ ප්‍රාදේශිය ව්‍යාප්තිය සැලකීමේ දී වැඩිම ණය ප්‍රමාණය වන රු. මිලියන 977 ක් ප්‍රතිලාභීන් 7,528 ක් අතර අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ (රූප සටහන 2.2). එමෙන්ම, අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව බලන කළ


අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව ඉහළ අගයක් පෙන්නුම් කරයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි බෝග වගා කරන ගොවීන් ඉලක්ක කර ගෙන ණය ප්‍රදානය කිරීම සඳහා පෞද්ගලික බැංකුවල පවතින ඉහළ ඉල්ලුම් සැලකිල්ලට ගෙන කාගිල්ස් බැංකුව හා පබ්ලික් බැංකුව ද 2017 වසරේ දී ණය ලබා දීම සඳහා එකතු වී ඇත.

**රූප සටහන 2.2 : 2017 වසරේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානිත ණය - දිස්ත්‍රික්ක අනුව**




2017 වසර තුළ බෝග වගාව අනුව ණය ප්‍රදානයන් සලකා බැලීමේ දී වී වගාව සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලැබී ඇති අතර එය සමස්ත ණය ප්‍රදානයන්ගෙන් සියයට 65 ක ප්‍රතිශතයක් වේ. තවද, විදේශ විනිමය ගලා යෑම අවම කිරීම සඳහා ආනයන ආදේශන ලෙස යොදා ගනු ලබන බඩඉරිඟු, එළවළු, වැනි බෝග සඳහා ද 2017 වසර තුළ දී වැඩි ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත (රූප සටහන 2.3).

**රූප සටහන 2.3 : බෝග අනුව ප්‍රදානිත ණය ප්‍රතිශතය - 2017**




### 2.4.3.1 මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) අවම වශයෙන් කිරි එළදෙනුන් 25 ක් සහිත මෙගා ගොවිපල 1,000 ක් ස්ථාපිත කිරීම සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වාණිජ මට්ටමේ කිරි නිෂ්පාදනය සඳහා දිරිමත් කිරීමේ අරමුණින් 2013 වසරේ දී ආරම්භ කරන ලදී. මේ යටතේ මධ්‍ය පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා කිරි නිෂ්පාදන කටයුතු සඳහා සියයට 6 ක වාර්ෂික පොලී සහනාධාරයක් තෝරා ගත් සහභාගීත්ව මූල්‍ය ආයතන 13 ක් සඳහා ගෙවනු ලබයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උපරිමය රු. මිලියන 25 ක් දක්වා ණය ප්‍රදානය කරනු ලබන අතර මාස 6 ක සහන කාලයක් ඇතුළත්ව ණය ආපසු ගෙවීමේ සහන

කාලය වසර 5 කි. මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ව්‍යවසායකයින්ගේ විශේෂ ඉල්ලීම මත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහයෝගය දැක්වීමේ අරමුණින් ගොවිපලක අවම කිරි එළදෙනුන් සංඛ්‍යාව 7 ක් දක්වා 2014 වසරේ දී අඩු කරන ලදී. ඒ අනුව, පසුගිය වසර කිහිපය පුරා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් ලබා දුන් ණයවල ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. 2014 වසර හා සංසන්දනය කිරීමේ දී ප්‍රදානිත ණය මුදල රු. මිලියන 1,389.57 සිට රු. මිලියන 1,648.46 දක්වා වැඩි වී ඇති අතර 2017 වසර තුළ දී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දුන් මෙම ණය සඳහා රු. මිලියන 91.02 ක පොලී සහනාධාර ලෙස රජය විසින් ගෙවා ඇත. 2017 දෙසැම්බර් 31 දිනට මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය 2.12 වගුවේ පරිදි වේ.

**වගුව 2.12 : මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය ප්‍රගතිය**

| වර්ෂය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රු. මිලියන) | ගෙවනු ලැබූ සහනාධාරය (රු. මිලියන) |
|---|---|---|---|
| 2013 | 112 | 719.62 | 1.80 |
| 2014 | 846 | 1,389.57 | 41.90 |
| 2015 | 1,950 | 1,616.61 | 80.10 |
| 2016 | 3,112 | 2,073.16 | 134.03 |
| 2017 | 1,671 | 1,648.46 | 91.02 |
| **එකතුව** | **7,691** | **7,447.42** | **348.85** |

මූලාශ්‍රය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2017 වසරේ ණය ප්‍රදානයන් සලකා බැලීමේ දී රු. මිලියන 560 ක වැඩිම ණය ප්‍රදානයන් ලංකා බැංකුව විසින් සිදු කර ඇති අතර මහජන බැංකුව හා එච්.ඩී.එෆ්.සී. බැංකුව විසින් පිළිවෙලින් රු. මිලියන 208 ක් හා රු. මිලියන 147 ක ණය ප්‍රදානය කර ඇත. තවද, අනෙකුත් බැංකු හා සැසඳීමේ දී හැටන් නැෂනල් බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ද ඉහළ ණය ප්‍රතිශතයක් ප්‍රදානය කර ඇත.

### 2.4.4 ගුදම් පහසුකම් සැලසීම.

ලෝක බැංකුවේ සහාය ඇතිව රජය විසින් ආරම්භ කිරීමට යෙදුනු නවීන පහසුකම්වලින් යුතු ගබඩා සංකීර්ණ මඟින් අස්වනු නෙලන කාලය තුළ දී ගොවීන් හට නව උත්පාදන ක්‍රමවේදයක් යටතේ ගුදම් පහසුකම් සැලසීමට කටයුතු කෙරේ. ඒ අනුව, කෘෂිකාර්මික දිස්ත්‍රික්කයන් තුළ මෙම ඉදි කිරීම් කරනු ලබන අතර මෙමඟින් වී, බඩඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස් මෙන්ම රටකජු සඳහා ගබඩා කිරීමට පහසුකම් සැලසේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ එසේ ගබඩා කරන ලද භාණ්ඩ සුරැකුම් ලෙස තබා ගණුදෙනු කළ හැකි මූල්‍යකරණ ලදුපතක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමයි. ඒ අනුව, අනුරාධපුරය, මොණරාගල සහ මන්නාරම යන දිස්ත්‍රික්ක තුනෙහි ගබඩා තුනක් ඉදි කර ඇති අතර එහි මුළු ධාරිතාව මෙ.ටො. 24,000 ක් පමණ වේ.

2017 වර්ෂය තුළ දී උපුල්දෙණිය (අනුරාධපුරය) ගබඩා සංකීර්ණයෙහි ගොවීන් 252 දෙනෙකු තම බෝග ගබඩා කරන ලද අතර එමඟින් ගොවීන් 36 දෙනෙක් රු. මිලියන 4.6 ක මුදලක් මෙම ලදුපත සුරැකුම් ලෙස තබා කෙටිකාලීන ණය පහසුකම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ලබා ගෙන ඇත. මෙම කාල සීමාව තුළ දීම බුත්තල (මොණරාගල) ගබඩා සංකීර්ණයේ ගොවීන් 129 දෙනෙකු තම බෝග ගබඩා කරන ලද අතර එමඟින් ගොවීන් 81 දෙනෙකු රු. මිලියන 12.3 ක මුදලක් කෙටි කාලීන ණය පහසුකම් ලෙස ලබා ගෙන ඇති අතර මන්නරම ගබඩා සංකීර්ණයේ ගොවීන් 85 දෙනෙකු තම ධාන්‍ය බෝග ගබඩා කරන ලද අතර එමඟින් ගොවීන් 58 දෙනෙකු රු. මිලියන 1.51 ක මුදලක් කෙටි කාලීන ණය පහසුකම් ලබා ගන්නා ලදී.

2017 දෙසැම්බර් 31 වන විට උපුල්දෙණිය ගබඩාවේ ධාන්‍ය වර්ග 5 ක් ගබඩා කර තිබූ අතර එයින් ප්‍රධාන වශයෙන් වී (මෙ.ටො. 285.5), සෝයා බෝංචි (මෙ.ටො. 251.6), බඩඉරිඟු (මෙ.ටො. 179.1), සහ තල (මෙ.ටො. 25.5) වේ. එසේම, මන්නාරම ධාන්‍ය ගබඩාවේ විවිධ වර්ගයේ වී ප්‍රභේද (මෙ.ටො. 683.5) ක් පමණ ගබඩා කරන ලදී. අස්වනු නෙලන කාලයේ දී අදාළ ප්‍රදේශයන්හි ගොවීන් මෙසේ සපයා ඇති ගබඩා පහසුකම් ප්‍රයෝජනයට ගන්නා අතර මිල ස්ථායි වූ අවස්ථාවේ දී ඔවුන් ඒවා විකිණීමට කටයුතු කරති.

ගබඩා කරන ලද මුළු අස්වනු තොගයේ වටිනාකම රු. මිලියන 33.5 ක් වන අතර එය විකුණන අවස්ථාවේ දී මුළු වටිනාකම රු. මිලියන 43.6 ක් විය. මේ අනුව ගොවීන් හට රු. මිලියන 10.1 ක ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකි වී තිබේ. මෙම අස්වනු තොගය සඳහා උපුල්දෙණිය ගබඩාවේ ගුදම් ගාස්තු වශයෙන් රු. මිලියන 1.1 ක් සහ පිරිසිදු කිරීමේ ගාස්තු වශයෙන් රු. මිලියන 0.41 ක මුදලක් ලබා ගෙන ඇත.

මෙම ගබඩා මඟින් ලබා ගෙන ඇති ප්‍රගතිය සැලකිල්ලට ගෙන රජය විසින් තවත් මෙවන් ගබඩා සංකීර්ණ 3 ක් ඉදි කිරීමට යෝජිතය. එනම්, පොළොන්නරුව, කිලිනොච්චිය හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි වේ. ඒ අනුව, රත්නපුර ගබඩා සංකීර්ණයේ ඉදි කිරීම් අවසන් කර ඇති අතර ජනතා මෙහෙවර සඳහා ඉතා ඉක්මණින් භාර දීමට නියමිතය. එසේම, කිලිනොච්චිය හා පොළොන්නරුව ගබඩා ඉදි කිරීම් නිම වෙමින් පවතී.

### 2.4.5 "කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණය

නියගයෙන්, ගං වතුරෙන් සහ වන අලින්ගෙන් ගොවීන්ගේ වගාවලට සිදු වන හානි සඳහා සහන ලබා දීමට ස්ථාපිත කරන ලද "කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණ යෝජනා ක්‍රමය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් 2017 වසර තුළ දී ද සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. 2017 වසරේ දී ගොවීන් 5,825 දෙනෙකුට ආසන්න වශයෙන් රු. මිලියන 30.71 ක් වගා හානි සඳහා වන්දි වශයෙන් ලබා දී ඇත.

2017 වසරේ අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදය තුළ පැවති දරුණු නියං තත්ත්වය නිසා, බෝග වගාවෙන් අඩක් පමණ හානි වූ අතර, එමඟින් කෘෂිකාර්මික හා ජීවනෝපාය කටයුතුවලට බාධා එල්ල විය. "කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් වගා හානි සහ ජීවනෝපාය අහිමි වීම නිසා සිදු වූ සත්‍ය හානියම ආවරණය නොවූ බැවින් වියළි සලාක ලබා දීමේ වැඩසටහන රජය මඟින් ක්‍රියාත්මක කරන ලදී. ගොවි ජනතාවගේ වගා හානි පියවීම සහ ජීවනෝපාය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් රු. බිලියන 5.2 ක් වියදම් කරන ලදී. "කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණ යෝජනා ක්‍රමයට සහ වියළි සලාක ලබා දීමේ වැඩසටහන සඳහා 2017 වසරේ දී වැය කළ මුදල් හා ප්‍රතිලාභීන් ගණන පහත දැක්වේ.

**වගුව 2.13 : 2017 වසරේ "කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණ යෝජනා ක්‍රමයේ සහ වියළි සලාක ලබා දීමේ ප්‍රගතිය**

| මාසය | "කෙතට අරුණ පොහොර දිරිය" වැඩසටහන | | වියළි සලාක ලබා දීමේ වැඩසටහන | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු.මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු. මිලියන) |
| ජනවාරි | 11 | 0.19 | - | - |
| පෙබරවාරි | 1,177 | 11.63 | - | - |
| මාර්තු | 233 | 1.11 | - | - |
| අප්‍රේල් | - | - | 230,050 | 2,300.50 |
| මැයි | - | - | 132,714 | 1,327.14 |
| ජුනි | 4,189 | 16.69 | 47,246 | 472.46 |
| ජුලි | 170 | 0.67 | 17,213 | 172.46 |
| අගෝස්තු | 45 | 0.42 | 86,201 | 862.01 |
| සැප්තැම්බර් | - | - | - | - |
| ඔක්තෝබර් | - | - | 9,912 | 99.12 |
| නොවැම්බර් | - | - | - | - |
| දෙසැම්බර් | - | - | - | - |
| **එකතුව** | **5,825** | **30.71** | **523,336** | **5,233.36** |

මූලාශ්‍රය : කෘෂිකාර්මික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලය

"කෙතට අරුණ පොහොර දිරිය" වගා රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් වී වගාව සඳහා වන හානි පමණක් ආවරණය වීමත් වගාව සඳහා වන සත්‍ය හානිය එයින් ආවරණය නොවීමත් යන හේතූන් නිසා රජයට සිදු වන මූල්‍ය අවදානම අවම වන හා ගොවීන් හට දුෂ්කරතාවයකින්


තොරව වන්දි ප්‍රදානය කළ හැකි දර්ශක මත පදනම් කරගත් (Index based) වගා රක්ෂණ යෝජනා ක්‍රමයක් පිළිබඳව ඉල්ලුමක් පවතී.

මෙම කරුණු සැලකිල්ලට ගෙන, වී සහ බඩඉරිඟු, සෝයා බෝංචි, ලොකු ලූණු, අර්තාපල් සහ මිරිස් යන අනෙකුත් බෝග වර්ග 5 ක් සඳහා, ජාතික වගා රක්ෂණ යෝජනා ක්‍රමය (NCIS) යටතේ 2018 අයවැය මඟින් අක්කරයකට රු. 40,000 ක රක්ෂණ ආවරණයක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සමඟ සම්බන්ධ වීමට කැමති ගොවීන් අක්කරයක් සඳහා රු. 1,800 ක් රක්ෂණ වාරික වශයෙන් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම වාරික මුදල් සෘජුවම ගොවීන්ගෙන් අයකර ගැනීම ගොවි ප්‍රජාව අතර නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති කරලීමට හේතු වන බැවින් මුළු වාරික මුදලම ගොවීන් වෙනුවෙන් රජය විසින් දැරීමට තීරණය කරන ලදී. ආසන්න වශයෙන් රු. මිලියන 3,000 ක් 2018 අයවැය මඟින් රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරික ගෙවීමට වෙන් කරන ලදී. ඒ අනුව, ගොවීන්ට අක්කරයකට රු. 40,000 ක රක්ෂණ ආවරණයක් නොමිලයේම ලබා ගත හැකි අතර එය පෙර පැවති රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ මෙන් 4 ගුණයකි. එපමණක් නොව රක්ෂණ ආවරණය ඇප සුරැකුම් ලෙස භාවිත කර අක්කරයක් සඳහා උපරිම වශයෙන් රු. 40,000 ක ණය මුදලක් ලබා ගත හැක.

### 2.4.6 ගොවීන් සඳහා සමාජ ආරක්ෂණය

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය වනුයේ රටෙහි කෘෂිකාර්මික දියුණුව වෙනුවෙන් තම තරුණ්‍ය කැප කර වියපත් වූ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. මෙම යෝජනා ක්‍රමය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක වේ. 2017 වසර අවසන් වන විට වැඩිහිටි ගොවීන් 148,201 දෙනෙකු මෙම යෝජනා ක්‍රමය මඟින් ප්‍රතිලාභ ලබා ගත් අතර රු. මිලියන 2,670 ක් විශ්‍රාම වැටුප් වශයෙන් 2017 වසරේ දී බෙදා දී ඇත. ගොවි විශ්‍රාම වැටුප් අරමුදල සතුව ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් මහා භාණ්ඩාගාරය රු. මිලියන 205 ක් මාසිකව විශ්‍රාම වැටුප් සඳහා කෘෂිකාමික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙයි. වර්තමානයේ දී ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීමට සුදුසුකම්ලත් ගොවීන් ඔවුන්ගේ මාසික ගොවි විශ්‍රාම වැටුප සෑම මසකම පළමු සතියේ දී තැපැල් කාර්යාලවලින් ලබා ගනු ලබයි.

**රූප සටහන 2.4 : ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රගතිය - 2017**




## 2.5 කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය

### 2.5.1 කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සඳහා වන සහායන්

ප්‍රධාන විදේශ විනිමය ඉපයීම් ක්‍රමයක් ලෙස දක්වන සුවිශේෂී දායකත්වය හේතුවෙන් වැවිලි කර්මාන්ත අංශයේ යහපත් වර්ධනය රටට ඉතා වැදගත් වේ. එබැවින්, නිදහසෙන් පසු බලයට පත්වුණු සියළුම රජයන් මෙම ක්ෂේත්‍රයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා කාලානුරූපීව අවශ්‍ය

ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, 2017 වසර කුඩා පරිමාණ වැවිලිකරුවන් උනන්දු කරලීම සඳහා දිරිදීමනා සහ සහනාධාර වැඩිපුර ලබා දුන් වසරක් ලෙසට හඳුනා ගත හැකිය.

| වගුව 2.14 : කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රගතිය, 2011 - 2017 | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | තේ | | රබර් | | පොල් | |
| | ව්‍යාප්තිය (හෙක්.) | මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑම් මිලියන) | ව්‍යාප්තිය (හෙක්.) | මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑම් මිලියන) | ව්‍යාප්තිය (හෙක්.) | මුළු නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
| 2011 | 206,104 | 328 | 128,120 | 158 | 394,836 | 2,303 |
| 2012 | 203,020 | 328 | 130,780 | 152 | 394,836 | 2,411 |
| 2013 | 202,408 | 340 | 133,668 | 130 | 394,836 | 2,061 |
| 2014 | 202,800 | 338 | 134,137 | 99 | 394,836 | 2,890 |
| 2015 | 202,800 | 329 | 134,906 | 89 | 394,836 | 3,027 |
| 2016 | 202,022 | 292 | 136,274 | 79 | 440,000 | 3,098 |
| 2017 | 202,540 | 308 | 135,632 | 83 | 440,000 | 2,449 |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.5.2 කුඩා පරිමාණ වැවිලිකරුවන් සඳහා නැවත වගා කිරීම සහ නව වගා ඇරඹීම සඳහා සහනාධාර ලබා දීම.

කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය තුළ උනන්දුව ඇති කරලීම සඳහා තේ සහ රබර් නැවත වගා කිරීමටත් නව වගා ආරම්භ කිරීමටත් රජය නොකඩවා දිරිදීමනා ලබා දී ඇත. ඒ අනුව, අක්කරයක තේ නැවත වගා කිරීම සඳහා සහ නව තේ වගාවන් ආරම්භ කරලීම සඳහා රු. 500,000 ක සහනාධාරයක් ලබා දී ඇත. තවද, රබර් නැවත වගා කිරීම සඳහා සහ නව රබර් වගා ආරම්භ කිරීම සඳහා පිළිවෙලින් අක්කරයක් සඳහා රු. 175,000 ක් සහ රු. 150,000 ක් සහනාධාර ලෙස ලබාදේ.

2017 වසරේ දී තේ සහ රබර් නැවත වගා කිරීමටත්, නව වගා ආරම්භ කිරීමටත් සහනාධාර වශයෙන් රජය විසින් රු. මිලියන 1,045 ක් කුඩා පරිමාණ වගාකරුවන් වෙත ලබා දී ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව 2017 වසරේ දී 25,509 ක පිරිසක් මෙම සහනාධාර ලබා ගෙන ඇත.

| වගුව 2.15 : කුඩා පරිමාණ වැවිලි ක්ෂේත්‍රයේ තේ සහ රබර් නැවත වගා කිරීමේ හා නව වගා ආරම්භ කිරීමේ ප්‍රගතිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | නැවත වගා කිරීමේ සහනාධාරය | | | | නව වගා ආරම්භ කිරීමේ සහනාධාරය | | | |
| | තේ | | රබර් | | තේ | | රබර් | |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර ප්‍රමාණය (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර ප්‍රමාණය (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර ප්‍රමාණය (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර ප්‍රමාණය (රු. මිලියන) |
| 2013 | 30,955 | 351.87 | 2,622 | 171.31 | 3,759 | 42.41 | 2,938 | 167.73 |
| 2014 | 16,555 | 258.09 | 2,004 | 219.07 | 3,381 | 66.98 | 2,247 | 213.47 |
| 2015 | 17,252 | 420.07 | 852 | 173.36 | 4,732 | 128.12 | 1,076 | 189.83 |
| 2016 | 24,995 | 531.89 | 668 | 337.51 | 3,759 | 46.73 | 942 | 179.90 |
| 2017 | 20,271 | 464.33 | 1,165 | 346.81 | 3,416 | 60.23 | 657 | 173.64 |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### 2.5.3 ලියාපදිංචි තේ කර්මාන්තශාලා හිමියන් සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය

තේ කර්මාන්තශාලා හිමිකරුවන් හට ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහාය වීමට 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ණය යෝජනා ක්‍රමය 2017 වසර දක්වාම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් කෙටි කාලීන පදනම මත රජයේ හා පෞද්ගලික අංශයේ වාණිජ බැංකු හරහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 6 ක් වන අතර මහා භාණ්ඩාගාරය විසින් සියයට 2 ක පොලී සහනාධාරයක් බැංකු වෙත ලබා දෙයි. මේ සඳහා රජය රු. මිලියන 516 ක් වසර 02 ක කාලයක පොලී සහනාධාර පියවීම සඳහා වෙන් කර ඇත (2016-2017).

2017 වර්ෂයේ දී තේ කර්මාන්තශාලා හිමිකරුවන් 222 කට කාරක ප්‍රාග්ධන ණය වශයෙන් රු. මිලියන 7,025 ක් ලබා දී ඇත. රජය විසින් රු. මිලියන 88.1 ක් මෙම ණය යෝජනා ක්‍රමයේ පොලී සහනාධාර පියවීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

**වගුව 2.16 : කාර්තුමය වශයෙන් කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය - 2017**

| විස්තරය | ප්‍රතිලාභ ලැබූ තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | ගෙවනු ලැබූ පොලී සහනාධාරය (රු. මිලියන) |
|---|---|---|
| 1 කාර්තුව | 220 | 26.21 |
| 2 කාර්තුව | 221 | 24.15 |
| 3 කාර්තුව | 220 | 21.86 |
| 4 කාර්තුව | 222 | 15.87 |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 2.6 ආහාර සුරක්ෂිතතාව

### 2.6.1 රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන

රටේ ප්‍රධාන ආහාරය බත් වන බැවින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වී නිෂ්පාදනය ප්‍රධාන සාධකයකි. කෙසේ වුවද, 2016/17 මහ, 2017 යල හා 2017/18 මහ යන අඛණ්ඩ වගා කන්න තුනක පැවති නියඟ තත්ත්වය නිසා 2017 වසර තුළ රටේ මුළු වී වගා අංශයටම බරපතල ගැටළුවලට මුහුණ දීමට සිදුවිය. ඒ අනුව, නියඟයෙන් පීඩාවට පත්ව ඇති වී වගා කළ ප්‍රදේශවල වී නිෂ්පාදනය උග්‍ර ලෙස පහත වැටී ඇත. 2016 වර්ෂයේ මෙ.ටො. මිලියන 4.42 ක් වූ වාර්ෂික වී නිෂ්පාදනය 2017 වර්ෂයේ දී මෙ.ටො. මිලියන 2.38 දක්වා අඩු වී ඇත (රූප සටහන 2.5).

**රූප සටහන 2.5 : වාර්ෂික වී නිෂ්පාදනය 2000 - 2017**




ඉහත රූප සටහන් අංක 2.5 හි දැක්වෙන විස්තර අනුව, 2000 වර්ෂයේ සිට වාර්තා වූ අඩුම වාර්ෂික වී නිෂ්පාදනය 2017 වර්ෂයේ නිෂ්පාදනය බව පැහැදිලිය. ඒ අනුව, සියයට 14 ක සාමාන්‍ය තෙතමනයට වඩා ඉහළ තෙතමනයක් තිබුන ද වී සඳහා ඉහළ ඉල්ලුමක් පෞද්ගලික අංශයේ මෝල් හිමියන් අතර නිර්මාණය විය. එබැවින්, 2017 දී වී මිල ගණන් ස්ථාවර කිරීමට රජයේ මැදිහත්වීමක් අවශ්‍ය නොවීය (වගුව 2.17).

| වගුව 2.17 : රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ මිල දී ගත් වී ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|
| **කන්නය** | **නාඩු (මෙ.ටො.)** | **සම්බා (මෙ.ටො.)** | **එකතුව (මෙ.ටො.)** | **වටිනාකම (රු. මිලියන)** |
| 2009/10 මහ | 63,850 | 6,919 | 70,769 | 1,995 |
| 2010 යල | 83,819 | 27,910 | 111,729 | 3,184 |
| **එකතුව** | **147,669** | **34,829** | **182,498** | **5,179** |
| 2010/11 මහ | 2,913 | 556 | 3,469 | 98 |
| 2011 යල | 58,967 | 16,205 | 75,172 | 2,137 |
| **එකතුව** | **61,880** | **16,761** | **78,641** | **2,235** |
| 2011/12 මහ | 107,319 | 8,467 | 115,786 | 3,259 |
| 2012 යල | 9,936 | 540 | 10,476 | 294 |
| **එකතුව** | **117,255** | **9,007** | **126,262** | **3,553** |
| 2012/13 මහ | 107,445 | 31,205 | 138,650 | 4,530 |
| 2013 යල | 81,834 | 12,542 | 94,376 | 3,058 |
| **එකතුව** | **189,279** | **43,747** | **233,026** | **7,588** |
| 2013/14 මහ | 3971 | 592 | 4563 | 148 |
| 2014 යල | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | **3,971** | **592** | **4,563** | **148** |
| 2014/15 මහ | 126,203 | 34,366 | 160,569 | 7510 |
| 2015 යල | 162,526 | 12,487 | 175,013 | 7,950 |
| **එකතුව** | **288,729** | **46,853** | **335,582** | **15,460** |
| 2015/16 මහ | 91,785 | 40,196 | 131,981 | 5,139 |
| 2016 යල | 11,054 | 14,384 | 25,438 | 1,056 |
| **එකතුව** | **102,839** | **54,580** | **157,419** | **6,195** |
| 2016/17 මහ | 0 | 0 | 0 | 0 |
| 2017 යල | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | **0** | **0** | **0** | **0** |
| **මුළු එකතුව** | **911,622** | **206,369** | **1,117,991** | **40,358** |

මූලාශ්‍රය : වී අලෙවි මණ්ඩලය

### 2.6.2 2017 වර්ෂයේ දී වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම.

වී අස්වැන්න අඩු වීම, ඉහළ තරගකාරීත්වයක් ඇතිව වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශය දිරිගැන්විය. එහි ප්‍රතිඵලයක් ලෙස වී මිල දී ගැනීම සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍ය නොවීය. එබැවින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු හරහා පෞද්ගලික අංශය විසින් ලබාගත් බැංකු අරමුදල් ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව වී මිල දී ගැනීම සඳහා බැංකු විසින් ලබා දුන් මුළු ණය ප්‍රමාණය සහ මුළු ණය අරමුදල් ප්‍රමාණය පහත වැටී ඇත. මුළු වී නිෂ්පාදනයේ අඩුවීම මෙයින් පිළිබිඹු වේ. කෙසේවුවද, ප්‍රධාන රාජ්‍ය බැංකු තුන වෙන වෙන ම සැලකිල්ලට ගත් කළ ප්‍රදේශීය සංවර්ධන බැංකුවේ ණය සංඛ්‍යාව වැඩි වී ඇති අතර මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකු දෙකම වර්ෂය තුළ වැඩි ණය අරමුදල් ප්‍රමාණයන් ලබා දී ඇත. කෙසේවුවද, ලංකා බැංකුව විසින් සැපයූ ණය සංඛ්‍යාවේ හා ණය අරමුදල් ප්‍රමාණයේ සීග්‍ර පහත වැටීමක් පෙන්නුම් කරයි. පෞද්ගලික අංශයේ බැංකු අතරින්, කොමර්ෂල් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව වී වගා අංශයට වඩාත් ආකර්ෂණීය ණය සපයන්නන් වී ඇති බව පෙනේ (වගුව 2.18).

| වගුව 2.18 : වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංසන්දනය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **බැංකුව** | **2016/17 මහ** | | **2017 යල** | | **එකතුව (2017)** | | **එකතුව (2016)** | |
| | **ණය සංඛ්‍යාව** | **මුළු ණය මුදල (රු. මිලියන)** | **ණය සංඛ්‍යාව** | **මුළු ණය මුදල (රු. මිලියන)** | **ණය සංඛ්‍යාව** | **මුළු ණය මුදල (රු. මිලියන)** | **ණය සංඛ්‍යාව** | **මුළු ණය මුදල (රු. මිලියන)** |
| මහජන බැංකුව | 145 | 5,976 | 67 | 1,124 | 212 | 7,100 | 236 | 3,096 |
| ලංකා බැංකුව | 182 | 9,627 | 278 | 10,370 | 460 | 19,997 | 777 | 27,077 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 68 | 302 | 72 | 282 | 140 | 584 | 48 | 171 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **රාජ්‍ය බැංකුවල උප එකතුව** | **395** | **15,905** | **417** | **11,776** | **812** | **27,681** | **1061** | **30,344** |
| කොමර්ෂල් බැංකුව | 117 | 398 | 325 | 1,224 | 442 | 1,622 | 133 | 1,699 |
| සම්පත් බැංකුව | 60 | 1,249 | 29 | 385 | 89 | 1,634 | 365 | 5,607 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 18 | 1,245 | 18 | 1,251 | 36 | 2,496 | 37 | 1,273 |
| සෙලාන් බැංකුව | 82 | 463 | 65 | 416 | 147 | 879 | 216 | 816 |
| ජාතික සංවර්ධන බැංකුව | 16 | 464 | 9 | 480 | 25 | 944 | 199 | 1,458 |
| හැටන් නැෂනල් බැංකුව | 227 | 2,160 | 204 | 2,160 | 431 | 4,320 | 254 | 2,447 |
| **පෞද්ගලික බැංකුවල උප එකතුව** | **520** | **5,979** | **650** | **5,916** | **1,170** | **11,895** | **1,204** | **13,300** |
| **මුළු එකතුව** | **915** | **21,884** | **1,067** | **17,692** | **1,982** | **39,576** | **2,265** | **43,644** |

මූලාශ්‍රය : අදාළ බැංකු

### 2.6.3 ජීවන වියදම

රට තුළ පැවති ස්වාභාවික ව්‍යසනයන් හා නියඟ තත්ත්වයන් රටේ ආර්ථිකය මත බලපෑ අතර එමඟින් රටේ ජීවන වියදම් කෙරෙහි ද අහිතකර බලපෑමක් ඇති විය. සියළුම කෘෂි නිෂ්පාදනවල අස්වනු හානිවීම, සීමිත නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුම් තත්ත්වයක් ඇති වීමට හේතු විය. එලෙසම දකුණු ආසියාතික හා නැගෙනහිර ආසියාතික ආර්ථිකයන් බොහොමයක් ද ස්වභාවික ව්‍යසනයන්ගේ බලපෑමට ලක්වීම ආනයනික භාණ්ඩවල මිල කෙරෙහි බලපෑවේය. මෙය 2017 වසර තුළ ආහාර සුරක්ෂිතතාවට විශාල පහරක් විය. ප්‍රධාන වශයෙන්, දේශීය සහල් සහ පොල් වෙළඳපොල මත අහිතකර බලපෑම් ඇති විය. ඊට අමතරව අර්තාපල්, ලොකු ලූනු, පරිප්පු, කරවල, අනෙකුත් ධාන්‍ය සහ මිරිස් ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගැනුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්ට අදාළව වූ සැපයුම, මිල හා අදාළ වන බදු අඛණ්ඩවම අධීක්ෂණය කර ඒවා සමාලෝචනය කරන ලදී. වැඩි බලතල සහිතව කාලෝචිත තීරණ ගැනීම සඳහා පිහිටුවන ලද ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් පිළිගත හැකි අවම ජීවන මට්ටමක් තහවුරු කිරීම සඳහා මූලාරම්භයන් රැසක්ම ගන්නා ලදී. පාරිභෝගිකයාට දැරිය හැකි සිල්ලර මිලක් තහවුරු කිරීම සඳහා ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත පැනවූ බදු ඉවත් කරන ලදී. අර්තාපල්, ලොකු ලූනු හා සහල් ආනයනයන් මත වූ බදු සැලකිය යුතු ලෙස අඩු කරන ලදී. අර්තාපල් සහ ලොකු ලූනු යන දෙවර්ගය සඳහා පැවති කිලෝවකට රු. 40/- ක් වූ බද්ද රු. 1/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් (SCL) ලෙස සංශෝධනය කරන ලදී.

ජීවන වියදම අවම කිරීම සඳහා පිළියමක් ලෙස සුපිරි වෙළඳසල් සහ ලංකා සතොස හරහා ආහාර පැසක් ලබා දෙන ලදී. මෙම පැස සඳහා සහල්, පරිප්පු, සීනි, හාල් මැස්සන්, ලූනු, අර්තාපල් සහ මැකරල් (ටින් මාළු) ඇතුළත් විය. ඒ අනුව, ඉහත සඳහන් ආහාර ද්‍රව්‍ය එහි ආනයනික පිරිවැයටම පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳසැල් ජාලය සහ ලංකා සතොස අලෙවිසල් හරහා රටපුරා පාරිභෝගිකයන් වෙත බෙදා දෙන ලදී.

බෙදා හැරීමේ ජාලය තවදුරටත් ශක්තිමත් කිරීමට ලොරි භාවිත කරමින් සහල් සහ පොල් සතිපොළවල් සහ බලයලත් වෙළඳසැල් හරහා බෙදා හරින ලදී. උත්සව සමය සැලකිල්ලට ගෙන මෙම වැඩසටහන 2018 අප්‍රේල් මස දක්වා ක්‍රියාත්මකව පවත්වාගන්නා ලදී. ආන්තික තත්ත්වයන් යටතේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ඇතැම් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත උපරිම සිල්ලර මිලක් (MRP) නියම කිරීමට රජයට සිදුවිය. තවද රජය සතු වී අලෙවි මණ්ඩලය යටතේ පවතින සියළු වී තොග සතොස හරහා සහල් කර ලංකා සතොස ශාඛා ජාලය හරහා සහනදායී මිලකට විකිණීම සඳහා රජය වැඩසටහනක් ආරම්භ කර තිබේ.

වෙළඳපොලේ හිඟයක් නිර්මාණය කරමින් පොල් නිෂ්පාදනය සීඝ්‍ර ලෙස පහත වැටිණි. 2017 වර්ෂයේ දී පොල් මිලෙහි ඉහළ නැගීම සැලකිය යුතු විය. ගෙඩියක සිල්ලර මිල රු 100/- ඉක්මවා ඉහළ නැඟුණි. මෙම තත්ත්වය සමනය කිරීමට මූලාරම්භයන් රැසක් ගන්නා ලදී. ඒ අනුව, ඉහත තත්ත්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත. පොල් මද යොදා ගන්නා

කර්මාන්ත සඳහා අවශ්‍ය පොල් මද (Coconut kernel) ආනයනය කිරීම හරහා පවත්නා පොල් සාමාන්‍ය පාරිභෝගිකයන්ගේ පරිභෝජනයට ලබා දුනි. වෙළඳපොල තුළ පොල් සඳහා දැරිය හැකි මිලක් සහතික කිරීම සඳහා අවසන් විසඳුමක් ලෙස ගෙඩියක් සඳහා රු. 75 /- ක MRP ක් පනවන ලදී. සාධාරණ මිලක් යටතේ සාමාන්‍ය ජනතාවට පොල් බෙදා දීම සඳහා කප්රුක වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ පොළින් පොළට ලොරි යවන ලද අතර එමගින් සාධාරණ මිලකට හිඟයකින් තොරව පොල් මිල දී ගැනීමට පාරිභෝගිකයින් හට අවස්ථාවක් සලසන ලදී.

### 2.6.4 සහල් ආනයනය කිරීම

දිගු කාලයක් පැවති නියං තත්ත්වයන් හේතුවෙන් වූ වී නිෂ්පාදනයේ අඩු වීම නිසා සහල් වෙළඳපොල අස්ථායී විය. නිෂ්පාදන පිරිවැය හා සැසඳීමේ දී පාරිභෝගික මිල ගණන් අසාධාරණ ලෙස ඉහළ නංවාලමින් වසර පුරා සහල් මිල ඉහළ යාමේ ප්‍රවණතාවයක් පැවතුණි. නියඟ තත්ත්වය අඛණ්ඩව වගා කන්න තුනක් පැවතීම නිසා කුඩා වී මෝල් හිමියන්ට වී මිල දී ගැනීමේ අවස්ථාව අවහිර වීමෙන් සුළු පිරිසක් වූ ප්‍රමුඛ පෙළේ දේශීය සහල් මෝල් හිමියන් සඳහා සහල් වෙළඳපොලේ ඒකාධිකාරී තත්ත්වයක් නිර්මාණය විය. මෙම තත්ත්වයන් යටතේ දේශීය සහල් නිෂ්පාදනයන්ට පමණක් සීමා වී පීඩා විඳීමට පාරිභෝගිකයාට ඉඩසැලසීම රජයට තවදුරටත් කල නොහැකි විය. සහල්වල සිල්ලර මිල අඩු කිරීම සඳහා සහල් ආනයනය සඳහා අදාළ වන බදු ඉවත් කර සහල් කිලෝවකට රු. 0.25 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පමණක් අය කරමින් සහල් ආනයනය කිරීමට පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ආනයනකරුවන් දිරිගන්වන ලදී. ඒ අනුව 2017 වර්ෂය තුළ දී මුළු සහල් ආනයනය මෙ.ටො. 747,636 ක් විය.

## 2.7 පශු සම්පත් අංශයේ සංවර්ධනය

### 2.7.1 කුකුළු ගොවිපළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

ශ්‍රී ලංකාව මැදි ආදායම් රටක් කරා ගමන් කිරීමත් සමඟ ඒක පුද්ගල වාර්ෂික කුකුළු මස් පරිභෝජනය කි. ග්‍රෑම් 8.5 කට සහ බිත්තර 108.4 දක්වා වර්ධනය වී ඇත. ඉල්ලුම වැඩි වීමත් සමඟ කුකුළු ගොවිපළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවයන් ඉහළ නංවමින් අපනයන වෙළඳපොලට පිවිසීමට ඉඩකඩ ලබා දී ඇත.

**වගුව 2.19 : දේශීය කුකුල් මස් හා බිත්තර නිෂ්පාදනයට අදාළ තොරතුරු**

| වර්ෂය | කුකුල් මස් නිෂ්පාදනය | | බිත්තර නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව (මෙ.ටො. '000) | සත්‍ය (මෙ.ටො. '000) | ඇස්තමේන්තුව (මිලියන) | සත්‍ය (මිලියන) |
| 2010 | අදාළ නැත. | 104.16 | අදාළ නැත. | 1,384.80 |
| 2011 | අදාළ නැත. | 116.76 | අදාළ නැත. | 1,711.22 |
| 2012 | අදාළ නැත. | 137.39 | අදාළ නැත. | 2,278.72 |
| 2013 | අදාළ නැත. | 144.54 | අදාළ නැත. | 2,074.94 |
| 2014 | 162.50 | 150.32 | 2,086.31 | 2,232.02 |
| 2015 | 152.00 | 164.45 | 2,203.00 | 2,294.08 |
| 2016 | 168.41 | 182.69 | 2,187.00 | 2,304.06 |
| 2017 | 189.21 | 196.60 | 2,739.12 | 2,856.09 |

මූලාශ්‍රය : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සත්ත්ව ආහාර සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය බඩඉරිඟු වන අතර වර්තමානයේ ඒ සඳහා මුළු අවශ්‍යතාවය දළ වශයෙන් මෙ.ටො. 500,000 ක් පමණ වේ. අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් දේශීය නිෂ්පාදනය 2016/2017 මහ කන්නයේ මෙ.ටො. 171,382 ක් සහ 2017 යල කන්නයේ දී මෙ.ටො. 26,535 ක් දක්වා පහත වැටිණි. ඒ අනුව, කුකුළු ගොවිපළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය බඩඉරිඟු කි. ග්‍රෑම් එකක් සඳහා රු. 10/- ක විශේෂ භාණ්ඩ හා සේවා බදු (SCL) සහනාධාර යටතේ බඩඉරිඟු ආනයනය කිරීමට රජය විසින් ආනයන බලපත්‍ර ලබා දීම සඳහා සත්ත්ව ආහාර නිෂ්පාදකයින්ට අවසර ලබා දී ඇත. සහනදායී මිල ගණන් යටතේ සත්ත්ව ආහාර නිෂ්පාදකයින් විසින් 2017 වර්ෂයේ දී බඩඉරිඟු මෙ.ටො. 182,190 ක් ආනයනය කර ඇත.

| වගුව 2.20 : බඩඉරිඟු වගාව | | |
|---|---|---|
| කන්නය | වගා කර ඇති භූමි ප්‍රමාණය (හෙක්.) | නිෂ්පාදනය (මෙ.ටො) |
| 2014/15 මහ | 60,954 | 230,871 |
| 2015 යල | 9,017 | 30,244 |
| 2015/16 මහ | 57,094 | 207,075 |
| 2016 යල | 10,650 | 36,555 |
| 2016/17 මහ | 69,206 | 171,382 |
| 2017 යල | 8,504 | 26,535 |
| මූලාශ්‍රය : කෘෂිකර්ම අමාත්‍යාංශය | | |

### 2.7.2 කිරි නිෂ්පාදන අංශය

රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වැදගත් දායකත්වයක් ලබා දෙන කර්මාන්තයක් ලෙස කිරි නිෂ්පාදන අංශය හැඳින්විය හැක. දේශීය කිරි ගොවීන් බහුතරයක් අමතර ආදායම් මාර්ගයක් ලෙස සුළු පරිමාණයෙන් මෙම කිරි කර්මාන්තයේ නිරත වෙති. එහි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික දේශීය කිරි නිෂ්පාදන වැඩි වීමේ ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පවතී. පෙර වර්ෂ හා සැසඳීමේ දී 2017 වර්ෂයේ දේශීය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 327.6 සිට ලීටර මිලියන 396 දක්වා වැඩි වී ඇති අතර එය සියයට 3 ක වර්ධනයකි. 2017 වර්ෂයේ සමස්ත කිරි ගවයින්ගේ ජනගහනය 284,400 සිට 296,250 දක්වා වැඩි වීම මෙයට හේතු වේ. කෙසේ වෙතත් මෙම දේශීය කිරි නිෂ්පාදනය සමස්ත දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයට 40 පමණක් වන අතර ඉතිරි සියයට 60 ආනයනය මඟින් සපුරා ගැනේ.

වාර්ෂිකව දේශීය කිරි සැපයුම වැඩි වුවත් සමස්ත දේශීය කිරි ඉල්ලුම අතර සැළකිය යුතු පරතරයක් පවතින අතර එය අවම කිරීම සඳහා දේශීය කිරි කර්මාන්තය වැඩි දියුණු කර වඩා තිරසාර හා ලාභදායී කර්මාන්තයක් බවට පත් කළ යුතුවේ.

වසර 2020 වන විට රට කිරි නිෂ්පාදනයන්ගෙන් ස්වයංපෝෂිත කිරීමේ ඉලක්කය "දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහන" තුළින් සපුරා ගැනීමට අවශ්‍ය සැලසුම් රජය විසින් මේ වන විට සකස් කර ඇත.

තවද, දේශීය කිරි කර්මාන්තය දියුණු කිරීමේ අරමුණින් දියර කිරි සඳහා පැවති සහතික මිල ඉහළ නැංවීම හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා බදු සහන ලබා දීම වැනි ක්‍රියාමාර්ග රාශියක් රජය විසින් ගෙන ඇත.


2016 අයවැය යෝජනාවලට අනුව දේශීය කිරිපිටි නිෂ්පාදනය දිරිමත් කිරීම හා පාරිභෝගිකයන්ට සහන මිලකට කිරිපිටි ලබා දීමේ අරමුණින් දේශීය කිරිපිටිවල මිල අඩු කරන ලදී. මෙම මිල පහත හෙළීමට සමගාමීව දේශීය කිරිපිටි නිෂ්පාදන සමාගම් සඳහා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව ලබා දෙනු ලබන මිල සහනාධාරය 2017 වසරේ දී ත් ක්‍රියාත්මක විය. ඒ අනුව, දේශීය කිරි නිෂ්පාදන සමාගම් වන මිල්කෝ (පුද්.) සමාගම හා පැලවත්ත කිරි නිෂ්පාදන සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ග්‍රෑම් 400 හා කිලෝ ග්‍රෑම් 1 කිරි පැකට් සඳහා ප්‍රතිපූර්ණය කරන මුදල පහත වේ.

| වගුව 2.21 : 2017 වසර තුළ දේශීය කිරිපිටි නිෂ්පාදකයින් වෙත ප්‍රතිපූර්ණය කරන ලද මුදල | | | | |
|---|---|---|---|---|
| සමාගම | ඒකකය | වෙළඳපොල මිල (රු.) | අයවැය මත පදනම්වූ විකුණුම් මිල (රු.) | සහනාධාර මිල (රු.) |
| මිල්කෝ (පුද්.) සමාගම | ග්‍රෑම් 400 | 320 | 295 | 218,562,500 |
| | කි. ග්‍රෑම් 1 | 790 | 735 | 37,007,025 |
| පැලවත්ත කිරි නිෂ්පාදන සමාගම | ග්‍රෑම් 400 | 325 | 295 | 192,582,930 |
| | කි. ග්‍රෑම් 1 | 810 | 735 | 113,159,550 |
| **එකතුව** | | | | **561,312,005** |
| මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | | | | |

ඉහත දැක්වෙන පරිදි 2017 වර්ෂය තුළ රජය විසින් රු. මිලියන 561 ක් දේශීය කිරිපිටි නිෂ්පාදකයන් සඳහා මිල සහනාධාර ගෙවීමට වැය කර ඇත.

දේශීය කිරිපිටිවලට සාපේක්ෂව ආනයනික කිරිපිටි ද දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයට 55 ක් සපුරාලන හෙයින් දේශීය කර්මාන්ත කෙරෙහි සැළකිය යුතු මට්ටමක බලපෑමක් ඇති කරයි. දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා 2017 වසර සම්පූර්ණ යොදය සහිත කිරිපිටි මෙ.ටො. 84,430 ක් මෙරටට ආනයනය කර ඇත. 2017 වසර තුළ ලෝක වෙළඳපොල කිරිපිටි මිල සීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර දේශීය කිරිපිටි ආනයනකරුවන්ගේ ඉල්ලීම සලකා බලා කිරිපිටිවලට අදාළ ආනයනික බදු අනුපාතයන් පහත දමන ලදී. ඒ අනුව, කිරිපිටි ආනයනකරුවන්ගේ ඉල්ලීම සලකා බලා කිරිපිටි සඳහා පනවා තිබූ ආනයනික තීරු බද්ද 2017 වසරේ දී ද සංශෝධනය කළ අතර ආසන්නතම සංශෝධනය 2017 ජූලි මාසයේ දී සිදු කරන ලදී. අදාළ බදු වෙනස් වීම් 2.6 රූප සටහනින් පෙන්නුම් කෙරේ.

රූප සටහන 2.6 : කිරිපිටි වලට අදාළ ජාත්‍යන්තර වෙළෙඳපල මිල
(2014 ජූනි සිට 2018 මාර්තු දක්වා)



## 2.8 ඉලක්කගත කණ්ඩායම් සඳහා විශේෂ දිරි දීමනා

### 2.8.1 ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දෙන විශේෂ පොලී අනුපාතිකය

රටෙහි සංවර්ධනය සඳහා තම තරුණ්‍ය කැප කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කර සුරක්ෂිත විශ්‍රාම දිවියක් ලබා දීමේ අරමුණකින් ඔවුන්ගේ ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාතයක් ලබා දී ඇත. ඒ අනුව, 2015 අතුරු අයවැය මඟින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක විශේෂ පොලී අනුපාතිකයක් ලබා දීමට යෝජනා කරන ලදී. එමඟින්, රුපියල් මිලියනයක් හෝ ඊට අඩු මුදලක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ විශේෂ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ස්ථාවර තැන්පතුවක් වශයෙන් තැන්පතු කරනු ලබන ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට එම තැන්පතු සඳහා සියයට 15 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ලබා දෙනු ලැබේ. තවද, මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී අදාළ බැංකුවලට තම සාමාන්‍ය පොලී අනුපාතයට අමතරව දැරීමට සිදු වන අතිරේක පිරිවැය කාර්තුමය වශයෙන් මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

මෙම යෝජනා ක්‍රමය 2017 වසරේ දී ද සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර වන අතර ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ගෙවන ලද අමතර පොලිය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කළ යුතු රු. මිලියන 13,462 ක් සඳහා සහභාගීත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂ බලපත්‍රලාභී වාණිජ බැංකු ප්‍රතිපූර්ණ ඉල්ලීම් රජය වෙත ඉදිරිපත් කර ඇත.

**වගුව 2.22 : ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දුන් විශේෂ පොලී යෝජනා ක්‍රමයේ කාර්තුමය ප්‍රගතිය - 2017**

| විස්තරය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපූර්ණය කළ යුතු මුදල (රු.) |
|---|---|---|
| 1 කාර්තුව | 452,012 | 4,491,407,234 |
| 2 කාර්තුව | 499,759 | 4,052,463,324 |
| 3 කාර්තුව | 489,810 | 2,780,088,775 |
| 4 කාර්තුව | 485,196 | 2,138,194,231 |
| **එකතුව** | | **13,462,153,564** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

තවද, 2017 අයවැය මගින් ද මෙම යෝජනා ක්‍රමය අඛණ්ඩව දිගටම ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද අතර, 2017 වසර තුළ දී ද බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ වාණිජ බැංකුවක රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් තැන්පත් කරන ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට සියයට 15 ක පොලියක් ලබා දෙනු ලැබේ.

### 2.8.2 සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

සමාජගත කරන ලද තරුණ අභ්‍යාසලාභීන්ට තම ජීවන වෘත්තිය සාර්ථක කර ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මහඟු අවස්ථාවක් උදා කර දී ඇත. මෙම තරුණයින්ට ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් හා ඔවුන්ගේ සමාජ ආර්ථික කටයුතු සංවර්ධනය සඳහා වන පසු අධීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගී වීමට ද හැකිවේ. තවද මෙම ණය යෝජනා ක්‍රමය හරහා ඔවුන්ගේ ජීවන වෘත්තිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආර්ථික පසුබිම ගොඩනැගෙන අතර යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට මුහුණ දීමට හැකි වන ලෙස ශක්තිමත් පදනමක් ගොඩ නැගෙයි. ඒ අනුව, සුදුසුකම් ලබන අභ්‍යාසලාභීන්ට කෘෂි හා සත්ත්ව පාලන කටයුතු සඳහා උපකරණ මිලට ගැනීම, කෘෂි ව්‍යාප්ත සේවාවන්, සත්ත්ව පාලනය, යන්ත්‍රෝපකරණ මිලට ගැනීම, ගෘහාශ්‍රිත කර්මාන්ත, ධීවර කටයුතු හා සුළු ව්‍යාපාර කටයුතු යනාදී විවිධ කටයුතු සඳහා වසරක සහන කාලයකට යටත්ව වසර 10 ක ණය ආපසු ගෙවීමේ පදනම මත උපරිමය 250,000 ක් දක්වා වූ ණය මුදලක් ලබා ගැනීමට හැකිවේ.

මෙම යෝජනා ක්‍රමයේ දෙවන අදියර 2016 වසරේ දී ආරම්භ වූ අතර රු. මිලියන 180 ක මුදලක් ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා ප්‍රතිලාභීන් 843 කට ලබා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.23 : සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය 2017**

| දිස්ත්‍රික්කය | ලබා දුන් ණය සංඛ්‍යාව | ලබා දුන් ණය ප්‍රමාණය (රු. මිලියන) |
|---|---|---|
| යාපනය | 326 | 71.1 |
| කිලිනොච්චිය | 162 | 30.4 |
| මුලතිව් | 113 | 24.3 |
| වව්නියාව | 39 | 8.6 |
| මන්නාරම | 43 | 9.1 |
| අම්පාර | 16 | 3.3 |
| ත්‍රිකුණාමලය | 76 | 18.5 |
| මඩකලපුව | 68 | 15.1 |
| **එකතුව** | **843** | **180.4** |

මූලාශ්‍රය : අදාළ බැංකු

දෙවන අදියර යටතේ රු. 525 ක ණය මුදලක් ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා පිළිවෙලින් රු. මිලියන 250 ක්, රු. මිලියන 200 ක් හා රු. මිලියන 75 ක් ලෙස ලබා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වැඩිම ණය ප්‍රමාණයක් යාපනය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එමගින් අභ්‍යාසලාභීන් 326 සඳහා ප්‍රතිලාභ හිමි වී ඇත.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ ණය මුදල් සපයනු ලබන අතර සියයට 8 ක් රජය විසින් දරනු ලබයි. ඒ අනුව, 2017 වසර තුළ රජය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොලී සහනාධාර ලෙස රු. මිලියන 2.7 ක් ලබා දී ඇත.

# 3. පරිපාලන හා මූල්‍ය කාර්යසාධනය

## 3.1 පරිපාලන අංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, 34 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන් විත වේ. එකී කාර්ය මණ්ඩලය මාණ්ඩලික නිලධාරීන් 13 දෙනෙකු හා සෙසු නිලධාරීන් 21 දෙනෙකුගෙන් සමන් විත වේ. 2017 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 41 ක් වන අතර එයින් තවදුරටත් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව හතකි. දෙපාර්තමේන්තුවේ පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් සංවර්ධනයට අදාළ 2017 වසරේ තොරතුරු පහත පරිදි වේ.

### 3.1.1 කාර්ය මණ්ඩලය

**වගුව 3.1 : 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුමත කාර්ය මණ්ඩලය**

| | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | මෙහෙයුම් කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 03 | අධ්‍යක්ෂ | 04 | 04 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 10 | 06 |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ල.ක්‍රි.සේ. III (අධි සේවක පදනම) | 01 | 01 |
| 06 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරි | 01 | 01 |
| 07 | සංවර්ධන නිලධාරි | 02 | 02 |
| 08 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 01 | 01 |
| 09 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 | 06 |
| 10 | කළමනාකරණ සහකාර | 01 | 01 |
| 11 | රියදුරු | 07 | 05 |
| 12 | කාර්යාල කාර්ය සහායක | 05 | 05 |
| ***එකතුව*** | | **41** | **34** |

**2017 වසර තුළ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ නිලධාරීන්**

1. කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2. පී.ජී.පී. රසාංජලී මෙය - සහකාර අධ්‍යක්ෂ
3. පී.එස්.එන්. පෙරේරා මෙය - සංවර්ධන නිලධාරි
4. එම්.ජී.සී. කලාදේවි මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර
5. එච්.ඒ.එන්. ශාන්ත මයා - රියදුරු
6. ආර්.ඒ.ටී.එම්. රණසිංහ මයා - රියදුරු
7. ඒ.ඒ. තාරික් මයා - කාර්යාල කාර්ය සහායක
8. කේ.සී.යු. ජේමතිලක මයා - කාර්යාල කාර්ය සහායක

**2017 වසර තුළ ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය නිලධාරීන්**

1. එන්.ඒ.කේ. සමරනායක මිය - සහකාර අධ්‍යක්ෂ
2. කේ.එස්.ඒ. ප්‍රියන්ත මයා - රියදුරු
3. එම්.එන්.එල්. ප්‍රේමතිලක මයා - රියදුරු
4. ඩී.ඒ.එස්. කනකරත්න මයා - රියදුරු
5. ආර්.එම්. කුලතුංග මයා - කාර්යාල කාර්ය සහායක

## 3.1.2 කාර්ය මණ්ඩල තොරතුරු

**වගුව 3.2 : දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2484542 | 2394908 | dgdf@dfd.treasury.gov.lk<br>atapattu.ampmb@dfd.treasury.gov.lk |
| කේ.ඒ.එස්.එස්. කේ. පෙරේරා මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2151416 | 2484955 | perera.kassk@dfd.treasury.gov.lk |
| කේ.ජී.පී. පුෂ්පකුමාර මයා | අධ්‍යක්ෂ | 2484507 | 2484955 | kumara.kgpp@dfd.treasury.gov.lk |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය | අධ්‍යක්ෂ | 2484605 | 2484955 | madampe.mkdn@dfd.treasury.gov.lk |
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා | අධ්‍යක්ෂ | 2484572 | 2484955 | hettiarachchi.pmk@dfd.treasury.gov.lk |
| එස්.එච්.වී. කුමාර මයා | අධ්‍යක්ෂ | 2484595 | 2484955 | kumara.shv@dfd.treasury.gov.lk |
| ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය | සහකාර අධ්‍යක්ෂ | 2484594 | 2484955 | liyanage.wlma@dfd.treasury.gov.lk<br>manorigl@yahoo.com |
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484596 | 2484955 | ranasinghe.radr@dfd.treasury.gov.lk<br>radranitha@gmail.com |
| පී.ජී.පී. රසාංජලී මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484829 | 2484955 | rasanjalie.pgp@dfd.treasury.gov.lk |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484854 | 2484955 | kotinkaduwa.jd@dfd.treasury.gov.lk<br>dilruksiko@gmail.com |
| ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා | සහකාර අධ්‍යක්ෂ | 2151494 | 2484955 | wickramage.wps@dfd.treasury.gov.lk |
| ඩී.ඩබ්. කුමාරගුරු මිය | සහකාර අධ්‍යක්ෂ | 2484501 | 2484955 | kumaraguru.dw@dfd.treasury.gov.lk |

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරක ථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ඩී.එල්.වී. විජේරත්න මෙය | සහකාර අධ්‍යක්ෂ | 2337527 | 2484955 | wijeratna.dlv@dfd.treasury.gov.lk |
| එච්.පී.එස්. ශාන්ත මහතා | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරි | 2484884 | 2484955 | shantha.hps@dfd.treasury.gov.lk |
| ඒ.එම්. වික්‍රමසිංහ මෙය | සංවර්ධන නිලධාරි | 2484884 | 2484955 | wickremasinghe.am@dfd.treasury.gov.lk |
| පී.එස්.එන්. පෙරේරා මෙය | සංවර්ධන නිලධාරි | 2484884 | 2484955 | perera.psn@dfd.treasury.gov.lk |
| ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 2484884 | 2484955 | geeshani.jmia@dfd.treasury.gov.lk |
| ටී. හේවාවසම් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | hewawasam.t@dfd.treasury.gov.lk |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | nilanthi.hada@dfd.treasury.gov.lk |
| එම්.ජී.සී. කලාදේවි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | kaladevi.mgc@dfd.treasury.gov.lk |
| ආර්.කේ. ලෙනෝරා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | lenora.rk@dfd.treasury.gov.lk |
| බී.ඒ.කේ.එස්.පී. ජයවීර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | jayaweera.baksp@dfd.treasury.gov.lk |
| ඩී.පී. සඳුනිකා මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | sandunika.dp@dfd.treasury.gov.lk |
| එස්.ජේ.ඒ.කේ.ඩී. රණසිංහ මයා | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | ranasinghe.sjakd@dfd.treasury.gov.lk |
| එම්.පී. ගුණවර්ධන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එස්.ඒ. කීර්තිසේන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| ජේ.එම්.ඒ.පී. ජයකොඩි මයා | රියදුරු | 2484862 | 2484955 | - |
| එච්.ඒ.එන්. ශාන්ත මයා | රියදුරු | 2484862 | 2484955 | - |
| ආර්.ඒ.ටී.එම්. රණසිංහ මයා | රියදුරු | 2484862 | 2484955 | - |
| ජේ.එම්.ඩී.ජේ.එස්. හේමන්ත මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |
| කේ.සී.යු. ප්‍රේමරත්න මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |
| ඒ.ඒ. තාරික් මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484855 | - |
| එම්.ආර්. ජයසිංහ මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484855 | - |
| ඩී.ඊ.කේ. පැලවත්තගේ මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484855 | - |

### 3.1.3 දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා, සම්මන්ත්‍රණ හා වැඩමුළු

වගුව 3.4 : දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා, සම්මන්ත්‍රණ හා වැඩමුළු

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| කේ.ජී.පී. පුෂ්පකුමාර මයා අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.17-2017.05.19 | මිලෝදා ආයතනය |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.12-2017.06.14 | මිලෝදා ආයතනය |
| | විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව | 2017.07.06 (එක් දින) | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව |
| | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | 2017.06.12-2018.06.12 | මිලෝදා ආයතනය |
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.12-2017.06.14 | මිලෝදා ආයතනය |
| එස්.එච්.වී. කුමාර මයා අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.12-2017.06.14 | මිලෝදා ආයතනය |
| ඩබ්ලිව්.එල්.එම්.ජේ. ලියනගේ මිය සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.16-2017.01.18 | මිලෝදා ආයතනය |
| | විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව | 2017.07.06 (එක් දින) | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව |
| | ITMIS – අභ්‍යන්තර විගණන පුහුණුව | 2017.11.27 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.01.16-2017.01.18 | මිලෝදා ආයතනය |
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය සහකාර අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.23-2017.05.25 | මිලෝදා ආයතනය |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය සහකාර අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.26-2017.05.30 | මිලෝදා ආයතනය |
| | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | 2017.06.12-2018.06.12 | මිලෝදා ආයතනය |
| ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා සහකාර අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.17-2017.05.19 | මිලෝදා ආයතනය |
| ඩී.ඩබ්. කුමාරගුරු මිය සහකාර අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.16-2017.01.18 | මිලෝදා ආයතනය |
| ඩී.එල්.වී. විජේරත්න මෙය සහකාර අධ්‍යක්ෂ | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.31-2017.06.02 | මිලෝදා ආයතනය |
| එච්.පී.එස්. ශාන්ත මයා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරි | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.19-2017.01.23 | මිලෝදා ආයතනය |

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| ඒ.එම්. වික්‍රමසිංහ මෙය සංවර්ධන නිලධාරි | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.19-2017.01.23 | මිලෝදා ආයතනය |
| පී.එස්.එන්. පෙරේරා මෙය සංවර්ධන නිලධාරි | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.05-2017.06.07 | මිලෝදා ආයතනය |
| | ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | 2017.09.26-2017.11.28 | මිලෝදා ආයතනය |
| ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.09-2017.01.11 | මිලෝදා ආයතනය |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.02.01-2017.02.03 | මිලෝදා ආයතනය |
| | ITMIS – අභ්‍යන්තර විගණන පුහුණුව | 2017.11.27 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.11.29-2017.11.30 | මිලෝදා ආයතනය |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | ලිපිගොනු කළමනාකරණය හා සාමාන්‍ය කාර්යාල පරිපාලන පුහුණුව | 2017.03.27-2017.03.29 | මිලෝදා ආයතනය |
| | ITMIS – සේවක කළමනාකරණ පුහුණුව | 2017.04.28 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.23-2017.05.25 | මිලෝදා ආයතනය |
| | පෞද්ගලික ලිපිගොනු ඵලදායීව කළමනාකරණය කිරීම පිළිබඳ පුහුණුව | 2017.05.16 (එක් දින) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| | රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ නිපුණතා පිළිබඳ පුහුණුව | 2017.08.16-2017.08.17 | මිලෝදා ආයතනය |
| | ITMIS – අභ්‍යන්තර විගණන පුහුණුව | 2017.11.27 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.11.29-2017.11.30 | මිලෝදා ආයතනය |
| එම්.ජී.සී. කලාදේවි මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.05-2017.06.07 | මිලෝදා ආයතනය |
| | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම පිළබඳ පුහුණුව | 2017.03.16 (එක් දින) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| | ගබඩා පාලනය පිළිබඳ පාඨමාලාව | 2017.09.07-2017.10.05 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.11.29-2017.11.30 | මිලෝදා ආයතනය |

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| ආර්.කේ. ලෙනෝරා මයා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.01.16-2017.01.18 | මිලෝදා ආයතනය |
| | වාහන හා යන්ත්‍රෝපකරණ පරිපාලනය පිළිබඳ පුහුණුව | 2017.03.28-2017.03.29 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| | ලංසු පත්‍රිකා හා ටෙන්ඩර් පටිපාටි සකස් කිරීම පිළිබඳ පුහුණුව | 2017.10.11-2017.10.13 | මිලෝදා ආයතනය |
| බී.ඒ.කේ.එස්.පී. ජයවීර මිය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | ලිපිගොනු කළමනාකරණය හා සාමාන්‍ය කාර්යාල පරිපාලන පුහුණුව | 2017.03.27-2017.03.29 | මිලෝදා ආයතනය |
| | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.26-2017.05.30 | මිලෝදා ආයතනය |
| | රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ නිපුණතා පිළිබඳ පුහුණුව | 2017.08.16-2017.08.17 | මිලෝදා ආයතනය |
| ඩී.පී. සඳුනිකා මෙය<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | ලිපිගොනු කළමනාකරණය හා සාමාන්‍ය කාර්යාල පරිපාලන පුහුණුව | 2017.03.27-2017.03.29 | මිලෝදා ආයතනය |
| | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.05.31-2017.06.02 | මිලෝදා ආයතනය |
| | ITMIS – අභ්‍යන්තර විගණන පුහුණුව | 2017.11.27 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.11.29-2017.11.30 | මිලෝදා ආයතනය |
| එස්.ජේ.ඒ.කේ.ඩී. රණසිංහ මයා<br>කළමනාකරණ සහකාර | ලිපිගොනු කළමනාකරණය හා සාමාන්‍ය කාර්යාල පරිපාලන පුහුණුව | 2017.03.27-2017.03.29 | මිලෝදා ආයතනය |
| | ITMIS – තොරතුරු තාක්ෂණ මූලික පුහුණුව | 2017.06.05-2017.06.07 | මිලෝදා ආයතනය |
| | රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ නිපුණතා පිළිබඳ පුහුණුව | 2017.08.16-2017.08.17 | මිලෝදා ආයතනය |
| | ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | 2017.09.26-2017.11.28 | මිලෝදා ආයතනය |
| | ITMIS – අභ්‍යන්තර විගණන පුහුණුව | 2017.11.27 (එක් දින) | මිලෝදා ආයතනය |
| | ITMIS – වත්කම් කළමනාකරණ පුහුණුව | 2017.11.29-2017.11.30 | මිලෝදා ආයතනය |
| ඩී.ඒ.එස්. කනගරත්න මයා<br>රියදුරු | රියදුරන්ගේ නිපුණතා සංවර්ධන පුහුණුව | 2017.05.23-2017.05.24 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| ජේ.එම්.ඒ.පී. ජයකොඩි මයා<br>රියදුරු | විද්‍යාත්මක සකසුරුවම් සහිත හා ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණුව | 2017.09.21 (එක් දින) | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ආර්.ඒ.ටී.එම්. රණසිංහ මයා<br>රියදුරු | විද්‍යාත්මක සකසුරුවම් සහිත හා ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණුව | 2017.09.21 (එක් දින) | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ඒ.ඒ. තාරික් මයා<br>කාර්යාල කාර්ය සහායක | සංවිධානාත්මක කාර්යාක්ෂමතාව සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව | 2017.08.25 (එක් දින) | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| එම්.ආර්. ජයසිංහ මයා කාර්යාල කාර්ය සහායක | සංවිධානාත්මක කාර්යාක්ෂමතාව සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව | 2017.08.25 (එක් දින) | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ඩී.ඊ.කේ. පැලවත්තගේ මයා කාර්යාල කාර්ය සහායක | යහපත් රැකියා පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින්ගේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ පුහුණුව | 2017.05.26 (එක් දින) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 3.1.4 විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

**වගුව 3.5 : විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ**

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත්වූ රටෙහි නම |
|---|---|---|---|
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය සඳහා සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දූත මණ්ඩල නියෝජනය | 2017.02.11-2017.02.18 | ඕස්ට්‍රේලියාව |
| | ඇ.ඩො. 200 ක ණය පහසුකම් ලබා දීම සඳහා පැවති පළමු ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුවේ දූත මණ්ඩල නියෝජනය | 2017.05.07-2017.05.10 | පකිස්ථානය |
| | සහල් ආනයනය කිරීමේ දූත මණ්ඩල නියෝජනය | 2017.07.09-2017.07.13 | පකිස්ථානය සහ මියන්මාරය |
| කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මයා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගෝලීය අගය දාම, අවදානම, අභියෝග හා අවස්ථාවන් සමඟ ඒකාබද්ධ කිරීම පිළිබඳ වැඩමුළුව | 2017.09.12-2017.09.17 | මොංගෝලියාව |
| කේ.ජී.පී. පුෂ්පකුමාර මයා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරීන්ගේ ධාරිතා ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන | 2017.10.21-2017.10.27 | මැලේසියාව |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය අධ්‍යක්ෂ | උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විධායක පුහුණු වැඩසටහන | 2017.02.12-2017.02.19 | සිංගප්පූරුව |
| | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරීන්ගේ ධාරිතා ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන | 2017.07.23-2017.07.29 | මැලේසියාව |
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා අධ්‍යක්ෂ | ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය සඳහා සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දූත මණ්ඩල නියෝජනය | 2017.02.11-2017.02.18 | ඕස්ට්‍රේලියාව |
| | සංවාද හා ගැටුම් නිරාකරණය පිළිබඳ විධායක පුහුණු වැඩසටහන | 2017.02.19-2017.02.26 | සිංගප්පූරුව |
| එස්.එච්.වී. කුමාර මයා අධ්‍යක්ෂ | රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිළිබඳ විධායක පුහුණු වැඩසටහන | 2017.03.18-2017.03.27 | ඕස්ට්‍රේලියාව |
| ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | ඵලදායී පාලනය සහ තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා සාර්ව ආර්ථික කළමනාකරණ පිළිබඳ වැඩසටහන | 2017.11.18-2017.12.17 | ඕස්ට්‍රේලියාව |
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය අංශයේ නායකත්ව හා තීරණ ගැනීම පිළිබඳ විධායක පුහුණු වැඩසටහන | 2017.01.22-2017.01.29 | සිංගප්පූරුව |
| ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා සහකාර අධ්‍යක්ෂ | සංවර්ධනය වෙමින් පවතින රටවල්වල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ හැකියා වර්ධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 2017.03.15-2017.04.06 | චීනය |
| ඩී.ඩබ්. කුමාරගුරු මිය සහකාර අධ්‍යක්ෂ | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2017.08.13-2019.10.31 | ජපානය |

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත්වූ රටෙහි නම |
|---|---|---|---|
| ඩී.එල්.වී. විජේරත්න මෙය සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය අංශයේ නායකත්ව හා තීරණ ගැනීම පිළිබඳ විධායක පුහුණු වැඩසටහන | 2017.01.22-2017.01.29 | සිංගප්පූරුව |
| එච්.පී.එස්. ශාන්ත මයා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නිලධාරි | 4 වන ආසියානු පෞද්ගලිකත්ව පාලම් සංසදය සඳහා වූ 2017 ICT පර්යේෂණ සම්මන්ත්‍රණය : දේශසීමා හරහා පෞද්ගලිකත්වය නිර්මාණය කිරීම. | 2017.11.07-2017.11.11 | දකුණු කොරියාව |
| ඒ.එම්. වික්‍රමසිංහ මෙය සංවර්ධන නිලධාරි | සංවර්ධනය වෙමින් පවතින රටවල්වල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ හැකියා වර්ධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 2017.03.15-2017.04.06 | චීනය |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 3.2 මූල්‍ය අංශය


දෙපාර්තමේන්තුවේ අරුමුණු ඉටු කර ගැනීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු. 5,608,078,050 ක ප්‍රතිපාදනයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු. 8,449,099,000 ක ප්‍රතිපාදන ද වශයෙන් රු. 14,057,177,050 ක මුළු ප්‍රතිපාදන මුදලක් 2017 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ 243 වැඩසටහන 01 හා වැඩසටහන 02 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම රු. 12,876,143,324 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. 4,770,946,489 ක් හා රු. 8,105,196,835 ක් විය. එකී වර්ෂය තුළ එම වියදම බෙදී ගිය ආකාරයත්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ විස්තරත් පිළිවෙලින් පහත වගු අංක 3.6 සහ 3.7 මඟින් පෙන්නුම් කෙරේ.

**වගුව 3.6 : අයවැය ඇස්තමේන්තු උපයෝජනය - 2017**

| වැය විෂය | ඇස්තමේන්තු වියදම (රු.) | සත්‍ය වියදම (රු.) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **5,608,078,050** | **4,770,946,489** |
| පුද්ගල පඩිනඩි | 26,400,000 | 26,122,408 |
| ගමන් වියදම් | 4,150,000 | 3,959,058 |
| සැපයීම් | 3,149,075 | 2,593,359 |
| නඩත්තු වියදම් | 3,154,410 | 2,935,490 |
| සේවා | 20,432,000 | 18,807,687 |
| සංවර්ධන සහනාධාර (පොළී සහනාධාර) | 5,550,792,565 | 4,716,528,487 |
| **ප්‍රාග්ධන වියදම්** | **8,449,099,000** | **8,105,196,835** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 2,620,000 | 2,277,552 |
| හැකියා වර්ධනය | 1,000,000 | 936,161 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැඩි දියුණු කිරීම (ජර්මන් රජය) | 305,804,481 | 287,738,665 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ආසියානු සංවර්ධන බැංකුව) | 7,640,479,000 | 7,498,406,525 |
| රජයේ ධාන්‍ය ගබඩා සංකීර්ණ ත්‍රිත්වය ඉදි කිරීම | 499,195,519 | 315,837,932 |
| **මුළු එකතුව** | **14,057,177,050** | **12,876,143,324** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

රූප සටහන 3.1 : දෙපාර්තමේන්තුවේ අයවැය ඇස්තමේන්තු හා සත්‍ය වියදම




වගුව 3.7 : රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2017

| විස්තරය | අනුමත සීමාව (රු.) | සත්‍ය වටිනාකම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 3,500,000 | 2,669,746.80 |
| අවම ලැබීම්වල සීමාව | 850,000 | 1,784,712.43 |
| උපරිම හර ශේෂයේ සීමාව | 13,000,000 | 6,167,949.37 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 3.3 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුව හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දුන් අතර ඔවුන් විසින් පෙන්වා දෙන ලද දුර්වලතා මඟ හරවා ගැනීමට ද අවශ්‍ය පියවර ගන්නා ලදී.

**වගුව 3.9 : විගණන විමසුම් - විගණකාධිපති දෙපාර්තමේන්තුව - 2017**

| ලිපිය ලැබුණු දිනය | විෂය | විගණකාධිපති දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|
| 2017.05.19 | 2016 අයවැය යෝජනා අනුව මිල අඩු කරන ලද දේශීය කිරිපිටි සඳහා කිරි නිෂ්පාදකයින් වෙත ප්‍රතිපූර්ණ ප්‍රදානයන් ලබා දීම. | 2017.06.16 |
| 2017.05.23 | විසර්ජන ගිණුම - 2016 | 2017.05.29 |
| 2017.06.13 | කාර්ය මණ්ඩල පරික්ෂාව - 2016 | 2017.06.16 |
| 2017.07.12 | ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව | 2017.07.18 |
| 2017.07.12 | ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන වාර්තාව - 2016 | 2017.08.08 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**වගුව 3.8 : විගණන විමසුම් - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - 2017**

| ලිපිය ලැබුණු දිනය | විෂය | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|
| 2017.01.09 | අභ්‍යන්තර විගණන මූලික වාර්තාව | 2017.01.27 |
| 2017.02.28 | කළමනාකරණ විගණන වාර්තාව - 2016 සිව්වන කාර්තුව | 2017.03.31 |
| 2017.06.23 | කළමනාකරණ විගණන වාර්තාව - 2017 පළමු කාර්තුව | 2017.07.04 |
| 2017.10.12 | 2017 වර්ෂයේ තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා තොරතුරු ලබා ගැනීම. | 2017.10.16 |
| 2017.10.20 | කළමනාකරණ විගණන වාර්තාව - 2017 දෙවන කාර්තුව | 2017.11.02 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව